වාර්ෂික වාර්තාව

2020-21



කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

දැක්ම

හොඳම ශ්‍රී ලාංකික සිටීසී හා සාම්ප්‍රදායික
තේ නිපදවීමේ හා අලෙවි කිරීමේ වඩාත්ම
පිළිගත් ආදර්ශය බවට පත්වීම.

මෙහෙවර

දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක
කරගනිමින් ඉහළ ගුණාත්මක බවින් යුත්
රසවත් හා පාරිභෝගික හිතකාමී ශ්‍රී ලාංකේය
තේ නිෂ්පාදනය කිරීම.



පටුන

03
පූර්විකාව

ආයතනික පැතිකඩ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම ____ 03
අපගේ ගමන්මග ____ 04
විශේෂ මූල්‍ය සිදුවීම් ____ 06
මූල්‍ය නොවන විශේෂ සිදුවීම් ____ 07
සභාපතිගේ සමාලෝචනය ____ 08
අධ්‍යක්ෂ මණ්ඩලය ____ 10
ආයතනික කළමනාකාරිත්වය ____ 11
සංවිධාන ව්‍යුහය ____ 12

15
කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

මෙහෙයුම් තොරතුරු ____ 16
කර්මාන්තශාලා අනුව ලාභ/(අලාභ) ____ 18
මාසික තේ නිෂ්පාදනය ____ 19
වාර්ෂික තේ නිෂ්පාදනය ____ 20
මාසික අමු දළු ලබාගැනීම ____ 21
වාර්ෂික අමු දළු ලබාගැනීම ____ 22
සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය ____ 24
විකුණුම් සාමාන්‍යය උන්නතාංශ සමඟ සැසඳුම ____ 26
ඉහළම මිල ගණන් සහ කාර්යසාධනය – 2020/21 ____ 28
මූල්‍ය සමාලෝචනය ____ 29
මානව ප්‍රාග්ධනය ____ 30
සමාජ ප්‍රාග්ධනය ____ 31
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව ____ 32

33
මූල්‍ය වාර්තා

විගණකාධිපති වාර්තාව ____ 34
ලාභ හෝ පාඩු සහ අනෙකුත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශය ____ 38
මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව ____ 39
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය ____ 40
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ____ 41
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති ____ 42
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ____ 47
මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන ____ 60
පූර්ව වර්ෂ දහය සඳහා විශේෂ මූල්‍ය සිදුවීම් ____ 66

ආයතනික තොරතුරු ____ (පසුපස ඇතුළත කවරය)

ඔබට මෙම වාර්ෂික වාර්තාව PDF ආකාරයෙන් අපගේ වෙබ් අඩවිය වන www.kalubowitiyanatea.lk වෙතින් ලබාගත හැක.

පූර්විකාව

ආයතනික පැතිකඩ - කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සහ 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සීමා සහිත බැඳීම් සමාගමකි. සමාගම ස්ථාපිත කරනු ලැබුයේ සී.ටී.සී. තේ නිපදවීම සඳහා වන අතර කොටසක් රු.10 ක් ලෙස කොටසක් රු.10 බැගින් තක්සේරු කරන ලද කොටස් මිලියන පහක් ලෙස රුපියල් මිලියන 50 කින් සමන්විත ආරම්භක ප්‍රාග්ධනයකින් එය 1994 අගෝස්තු 1 වන දින වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලදී. ඉන්දීය ණය ආධාර යටතේ ආරම්භක ප්‍රාග්ධනය සපයන ලදී. ඒ අන්දමින්ම ඉන්දීය ණය ආධාර යටතේ අපගේ දෙවන කර්මාන්තශාලාව වූ දෑරංගල තේ කර්මාන්තශාලාව ද ස්ථාපිත කරන ලද අතර 2000 මාර්තු මාසයේදී මෙහෙයුම් ආරම්භ කරන ලදී. කළින් තේ ශක්ති අරමුදල යටතේ පැවැති අපගේ තෙවන කර්මාන්තශාලාව වූ හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව ලාභ බෙදාහදා ගැනීමේ ගිවිසුමක් යටතේ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට පවරන ලදී. සමාගමේ අරමුදල් යොදා ගනිමින් සමාගම මෙම කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කරනු ලැබූ අතර හිනිදුම තේ කර්මාන්තශාලාව 2012 වසරේ සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී.

සමාගමට අළුතින්ම එකතු වූ මැණික්දිවෙල කර්මාන්තශාලාව කළින් තේ ශක්ති අරමුදලට හිමිව තිබූ අතර එය මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ඡන්ද කොට්ඨාශයේ මැණික්දිවෙල ගම්මානයේ පිහිටා ඇත. මෙම කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම සඳහා ද සමාගමේ අරමුදල් භාවිතා කරන ලදී.

කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදී ගනු ලබන තෝරාගත් අමු දළු යොදා ගනිමින් සමාගම ආසන්න වශයෙන් ඉතා උසස් තත්වයේ නිමි තේ කිලෝග්‍රෑම් 2,000,000 ක් පමණ වාර්ෂිකව නිපදවයි.

කළුබෝවිටියාන කර්මාන්තශාලාව කැපීම, ඉරීම සහ රැළි ගැස්වීම යන ක්‍රියාවලිය භාවිතා කරමින් සීටීසී තේ වර්ගයේ නිමි තේ නිපදවන අතර දෑරංගල, හිනිදුම සහ මැණික්දිවෙල කර්මාන්තශාලා සම්මත සම්ප්‍රදායික ක්‍රියාවලිය යොදා ගනිමින් පත්‍රීය සහ කුඩා ශ්‍රේණිවල නිමි තේ වර්ග පෙළක් නිපදවයි.

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට අයත් 4 ISO 22000:2005 සහතිකලත් කර්මාන්තශාලා මගින් ගෝලීය වෙළඳපොළ සඳහා උසස්ම තත්ත්වයේ නැවුම් ලංකා තේ නිපදවන අතර දිවයිනේ ප්‍රමුඛතම සීටීසී තේ නිෂ්පාදකයා ලෙස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ සුදුසුකම්වලට සැලකිය යුතු සන්නාම වටිනාකමක් එකතු කරයි. ලෝක මට්ටමේ තේ නිෂ්පාදකයකු වීම සඳහා වන සිය කැපවීම වෙර ගන්වමින්, යහපත් නිෂ්පාදන පරිචයන්ට අතිරේකව, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම ග්ලෝබල් ගැප් රාමුව, RA/UTZ ප්‍රමිති සහ මාර්ගෝපදේශ ඇතුළුව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත නිෂ්පාදන පරිචයන් යොදා ගෙන තිබේ.

සමාගමේ තේ නිපැයුමෙන් 90%ක් පමණ තැරැව්කරුවන් හරහා කොළඹ නිමි තේ වෙන්දේසිය වෙත යොමු කරන අතර සුළු ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ, කර්මාන්තශාලාවල සහ දීප ව්‍යාප්තව පිහිටා ඇති අලෙවි මධ්‍යස්ථාන හරහා දේශීය වෙළඳපොළ තුල අලෙවි කරනු ලැබේ.

සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව සමාගමේ විධිනියෝගය පහත දැක්වෙන පරිදි වේ.

- වගාකරුවන්ගෙන් මිලදී ගත් තේ දළු පිරියම් කිරීම, පිරිසැකසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය සිදු කිරීම.
- තේ සිටුවීම, වගා කිරීම සහ තේ වතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.

වෙළඳ නාම සහ තේ වර්ග

පහසුවෙන් භාවිතයට ගත හැකි කුඩා පැකට්ටුවල ඇසුරෑ තේ මගින් කාර්ය බහුල ලෝකයට සැබෑ තේ රස ලබා දීමට උපකාර වන පීඑෆ් 1 කළුබෝවිටියාන සමාගමේ සීටීසී තේවල උසස්ම ශ්‍රේණිය වන අතර සමාගම සීටීසී නිෂ්පාදනයේ දිවයිනේ ප්‍රමුඛයා වන අතර මෙරට පාරිභෝගිකයන් අතර ජනප්‍රිය වෙමින් පවතී.

දෑරංගල සහ හිනිදුම තේ ඒවායේ විවිධ හැඩයෙන් යුතු තද පැහැති කොළ නිසා ප්‍රකටව ඇති අතර පැසීමට සැලස්වූ විටදී කඳිම රත් පැහැයකට පත් වන අතර එහි සුවිශේෂී රසය අනෙකුත් කලාප හයෙහිම රසයට වඩා වෙනස් වේ.

මැණික්දිවෙල ලකුණ යටතේ සම්ප්‍රදායික පහත රට තේ නිපදවන අතර එම තේ එයටම ආවේණික සුවිශේෂී රසයකින් යුක්ත වේ.

අපගේ නිපැයුම්

සීටීසී

බී පී 1	පී ඩී	පී එෆ් 1

සම්ප්‍රදායික

එෆ් බී ඕ පී 1	එෆ් බීඕ පී එෆ්	බී ඕ පී 1	එෆ් බී ඕ පී එෆ්
එෆ් බී ඕ පී	බී ඕ පී	ඕ පී 1	සිල්වර් ටිප්
එෆ් බී ඕ පී එෆ් ඩ. පී.	පෙකෝ	ඕ පී	

ප්‍රමිතිය

අපගේ නිමි තේ ඒවායේ විශිෂ්ඨ ගුණාත්මකබව නිසා කීර්තියට පත්ව ඇති අතර පිළිගත් තත්ත්ව සහතික, නිෂ්පාදන වගකීම පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා සහතික කරනු ලැබ තිබේ. සියලු නිපැයුම් සහ ක්‍රියාදාම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ලද ISO 22000:2005 සහ HACCP සමග පූර්ණව අනුකූල වන අතර ඊට අමතරව සියලුම කර්මාන්තශාලාවලට යහපත් නිෂ්පාදන පරිචය (GMP) පිළිබඳ සහතිකකරණය හිමිව තිබේ. සියලු කළුබෝවිටියාන තේ නිෂ්පාදන කර්මාන්තශාලා සඳහා ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය (ISO 22000:2005 සහ HACCP) ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම නිෂ්පාදන වගකීම කෙරෙහි අපගේ වගකීම ශක්තිමත් කරන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භයේ සිට අවසානය දක්වා තත්ත්ව ප්‍රමිති පවත්වා ගනු ලබන බව සහතික කරයි. බැර ලෝහ තිබේද යන්න සොයා බැලීම සඳහා නිමි තේ වල ගුණාත්මකබව වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක නිර්ණායක සහ කෘෂි රසායනික අවසාදිත ISO 3720 ප්‍රමිතියේ අවශ්‍යතාවයන් ප්‍රකාරව වේ.

අපේ ගමන් මග


1992/93
කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම ස්ථාපිත කරන ලදී.
1994/95
කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී.
1998/99
ට්‍රාන්ස් වර්ල්ඩ් ස්ටාර් සම්මානය - ආර්ථික විද්‍යා අධ්‍යයන ආයතනය - ඉන්දියාව.
2000/01
දෑරංගල තේ කර්මාන්තශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී.
2005/06
සිටිසි පහතරට තේ කාණ්ඩයේ ඉහළම විකුණුම් සාමාන්‍යය - ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් තේ තැරැව්කාර (පුද්) සමාගම.
2006/07
සමස්ත දිවයිනේ සිටිසි පහතරට තේ කාණ්ඩයේ දිවයිනේ වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් තේ තැරැව්කාර (පුද්) සමාගම.
2009/10
දෙවන ස්ථානය - වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව ගෝල්ඩන් කප් සම්මානය.
2010/11
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - රුසියාව.
2011/12
සමස්ත ලංකා සිටිසි තේ වැඩිම ඉහළ මිල සංඛ්‍යාව - පහත රට කාණ්ඩය - ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් තේ තැරැව්කාර (පුද්) සමාගම.
2012/13
නිහිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී.


2013/14
ජාතික වැවිලි සම්මානය - හොඳම මහා පරිමාණ තේ කර්මාන්තශාලාව.
2014/15
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - ඩුබායි (රන් හා රිදී පදක්කම් ජයග්‍රාහක).
2015/16
සමාගමට අළුතින්ම එක්වූ මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව විවෘත කිරීම.
2016/17
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - චීනය.
2017/18
නව තේ ඇසුරුම දියත් කරන ලදී.
2018/19
රේන්ෆොරස්ට් ඇලයන්ස් තිරසර සහතිකය හිමිකර ගන්නා ලදී.
2019/20
නව වෙබ් අඩවිය හා නව තේ ඇසුරුම් දියත් කරන ලදී.
2020/21
නව ස්ථානයක අපගේ අළෙවි සැල විවෘත කරන ලදී.

විශේෂ මූල්‍ය සිදුවීම්

වගුව - 01

මාර්තු 31න් අවසන් වසර සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම	2020/2021 රු.	2019/2020 රු.
ආදායම	**1,175,716,247.36**	937,789,275.06
විකුණුම් පිරිවැය	**(1,158,860,303.57)**	(845,680,912.50)
දළ ලාභය	**16,855,943.79**	92,108,362.56
අනෙකුත් මෙහෙයුම් ආදායම	**15,240,381.46**	7,201,625.87
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය/(අලාභය)	**32,096,325.25**	99,309,988.43
පරිපාලන වියදම්	**(43,913,954.35)**	(50,712,394.91)
විකුණුම් සහ බෙදාහැරීම් වියදම්	**(646,594.68)**	(400,677.07)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභය	**(12,464,223.78)**	48,196,916.43
මූල්‍ය ආදායම	**11,508,748.27**	14,724,355.11
මූල්‍ය වියදම්	**(14,189,483.93)**	(19,653,694.91)
ශුද්ධ මූල්‍ය ආදායම	**(2,680,735.66)**	(4,929,339.80)
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	**(15,144,959.44)**	43,267,576.63
බදුකරණය	**1,001,556.55**	(5,535,371.27)
බදුකරණයට පසු ශුද්ධ ලාභය	**(14,143,402.89)**	37,732,205.36
කොටසක් සඳහා ඉපැයුම්	**(3.07)**	8.19

ප්‍රස්තාරය - 01

ශුද්ධ විකුණුම්

(රු. මිලියන)



ප්‍රස්තාරය - 02

මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය

(රු. මිලියන)



ප්‍රස්තාරය - 03

බදුකරණයට පසු ශුද්ධ ලාභය

(රු. මිලියන)



ප්‍රස්තාරය - 04

අමු දළු සැපයම්කරුවෝ



මුළු සැපයුම්කරුවන්

3,658 දෙනෙකි

ප්‍රස්තාරය - 05

අමු දළු ලබාගැනීම්



මුළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම්

8,271,529

ප්‍රස්තාරය - 06

තේ නිෂ්පාදනය



මුළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම්

1,716,130

වගුව - 02

කර්මාන්තශාලාව	අමු දළු සැපයුම්කරුවෝ (සංඛ්‍යාව)	අමු දළු ලබාගැනීම් (කි.ග්‍රෑම්)	තේ නිෂ්පාදනය (කි.ග්‍රෑම්)
– කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව	2,423	4,375,321	916,577
– දෑරංගල තේ කර්මාන්තශාලාව	784	1,517,906	314,390
– හිනිදුම තේ කර්මාන්තශාලාව	159	1,577,904	321,655
– මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව	292	800,398	163,508

ශ්‍රී ලංකාවෙන් තේ ආනයන කළ රටවල් 2021



2021 මාර්තු 31න් අවසන් වූ මුල්‍ය වසර සඳහා වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. විදේශ විනිමය ඉපැයීමේදී සහ රැකීරක්ෂා සැපයීමේදී තේ කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. ශතවර්ෂයකට වැඩි කාලයක් මුළුල්ලෙහි තේ කර්මාන්තය ප්‍රධානම රැකියා සපයන්නාද, විදේශ විනිමය ඉපයීමේ ප්‍රධානම මූලාශ්‍රයද රජයේ ප්‍රධානම ආදායම් ප්‍රභවයද වී තිබේ. කොවිඩ් 19 වසංගතයේ බලපෑම හේතුවෙන් සමාලෝචිත කාල පරිච්ඡේදය ශ්‍රී ලංකා තේ කර්මාන්තයට අභියෝගාත්මක එකක් වූ අතර ඒ හේතුවෙන් තේ කර්මාන්තයේ මෙහෙයුම් පසුබෑමට ලක් වූ අතර ඉල්ලුම හා සැපයුම, ව්‍යවහාර මුදල්, තේ ආනයන කරන රටවල දේශපාලන පරිසරය, තේ කර්මාන්තයට දැඩිව බලපාන ප්‍රතිපත්ති තීරණ ආදියේ උච්චාවචන හේතුවෙන් සාර්ව ආර්ථික සාධක තේ කර්මාන්තයේ රාමුවට මූලිකවම අභියෝග කිරීම අඛණ්ඩව සිදුවූ අතර ගෝලීයව දැඩි බලපෑමක් ඇති කරන කෘෂිකර්මාන්තයේ සහ සහ භෝග නිෂ්පාදනයේ තීරණාත්මක සාධකයක් වන දේශගුණික විපර්යාස තේ කර්මාන්තය විසින් සලකා බැලිය යුතු සාධකයකි.

ගෝලීය අභියෝග

කොවිඩ්-19 වසංගතය ගෝලීයව කර්මාන්ත කෙරෙහි නිශේධනාත්මක බලපෑමත් ඇති කළ අතර වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ව්‍යාපාර පද්ධති හා දෛනික කාර්යයන්ට බාධා එල්ල කරන ලදී. ගෝලීය ව්‍යාපාරික වෙළඳපොළ වත්මනෙහි අත්විඳිමින් සිටින දුෂ්කරතාවලින් තේ කර්මාන්තයට ද ගැලවීමක් නොවූ අතර සීමිත නිෂ්පාදන ප්‍රවේශය. නිෂ්පාදනය අඩුවීම, ආදායම අහිමිවීම, අවිනිශ්චිතතාව ගෝලීයව තේ කර්මාන්තයට බලපෑ සාධක අතුරින් කිහිපයකි.

2019 වසරේ කිලෝග්‍රෑම් මිලියන 300.12 හා සැසඳීමේදී, 2020 වසර සඳහා ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 278.44 ක් ලෙස වාර්තා විය (කිලෝග්‍රෑම් මිලියන 21.63ක අඩුවීමකි). 2019 වසරට සාපේක්ෂව උඩරට, මධ්‍යම හා පහතරට තේ නිෂ්පාදන ධාරිතාවයේ අඩුවීමක් පෙන්නුම් කළේය.

2019 වසර හා සැසඳීමේදී සිටිසි උඩරට හා මධ්‍ය තේ නිෂ්පාදනය වර්ධනයක් පෙන්නුම් කරන අතර පහතරට තේ නිෂ්පාදනයේ පහළ යාමක් පෙන්නුම් කරයි. 2019 වසරේ එම කාල සීමාව හා සැසඳීමේදී නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 21.63 කින් අඩුවී තිබේ. (1997 සිට අඩුම) එසේම 2019 වසරේ එම කාල සීමාව හා සැසඳීමේදී අපනයන කිලෝග්‍රෑම් මිලියන 27.09 කින් අඩුවී තිබේ.

2020 වසර සඳහා අලෙවි කළ තේ වර්ගවල සමස්ත ජාතික සාමාන්‍යය කිලෝග්‍රෑමයක් සඳහා රු. 628.21 ක් (ඇ.ඩො. 3.39) වූ අතර 2019 වසරේදී එය රු. 544.54 (ඇ.ඩො. 3.05) විය. 2020 වසරේ එම මිල එතෙක් මෙතෙක් වාර්තා වූ ඉහළම සාමාන්‍යය විය. 2019 වසරේ එම කාල සීමාව හා සැසඳීමේදී, 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලසීමාව තුළ උඩරට, මධ්‍යම හා පහතරට තේ සඳහා ලැබුණු මිලේ සාමාන්‍යය රුපියල් හා ඩොලර් අනුපාතයන්ට අනුව වැඩිවීමක් පෙන්නුම් කරයි.

2019 වසරේ අනුරූප කාලසීමාව හා සැසඳීමේදී, නිෂ්පාදනයේ ඉහළම වෙළඳපොල කොටස වන 60.94%ක් සහිත පහතරට තේ නිෂ්පාදනය උන්නතියක් වාර්තාකළ අතර (+රු. 89.71) උඩරට හා මධ්‍ය ප්‍රදේශ තේ නිෂ්පාදනයද පිළිවෙළින් +රු. 72.27ක සහ රු. +84.98ක වර්ධනයක් වාර්තා කරන ලදී.

රටවල් අනුව අපනයන විශ්ලේෂණය කිරීමේදී, 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ ඉහළම තේ ආනයනය කරන්නා බවට තුර්කිය පත්වූ අතර ඉරාකය සහ රුසියාව දෙවන සහ තුන්වන ස්ථානයේ පසුවූ අතර ඉරානය සිව්වැනි ස්ථානයේ පසුවිය. කෙසේවෙතත්, 2019 හා සැසඳීමේදී තුර්කිය හා ඉරාකය වෙත තේ අපනයනය පිළිවෙළින් කිලෝග්‍රෑම් මිලියන 0.22 කින් හා කිලෝග්‍රෑම් මිලයන 5.03කින් පහත වැටුණු අතර රුසියාව වෙත සිදුකළ තේ අපනයන කිලෝග්‍රෑම් මිලියන 0.54කින් වැඩිවී තිබේ. ඉරානය වෙත සිදුකළ තේ අපනයන කිලෝග්‍රෑම් මිලියන 7.14කින් අඩුවූ අතර චීනය වෙත අපනයන

කිලෝග්‍රෑම් මිලියන 2.25කින් වැඩි විය. අනෙකුත් CIS රටවල් වෙත තේ අපනයනය කිලෝග්‍රෑම් මිලියන 1.66 කින්ද, සිරියාව වෙත අපනයන කිලෝග්‍රෑම් මිලියන 1.45 කින්ද අඩුවූ අතර චිලී රාජ්‍යය වෙත තේ අපනයනය කිලෝග්‍රෑම් මිලියන 2.19කින් වැඩි විය.

යුරෝපය සහ මධ්‍යම ආසියාව වෙත තේ අපනයනය 2020 වසරේදී 2.9%කින් පහත වැටී ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.

සමාගමේ කාර්යසාධනය

මෙම අභියෝගාත්මක පසුබිම මධ්‍යයෙහි වුවද, සමාගම සමාලෝචිත වර්ෂය තුළ රු මිලියන 938 ක ආදායමක් සහ රු.මිලියන 37.7 ක පශ්චාත් බදු ලාභයක් වාර්තා කරන ලදී.

අපගේ උපායමාර්ගය

ගුණාත්මකබවින් ඉහළ නිමි තේ නිෂ්පාදන නිපැයුම පිණිස අපගේ මූලික ඉලක්කය පහත දැක්වෙන යහපත් නිෂ්පාදන පරිවයන්ගෙන් සමන්විත වේ. මෙම සංදර්භය තුළ, සමාගමේ අවසන් අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අමුද්‍රව්‍ය, පිරිසැකසුම සහ අලෙවිකරණය මත ගුණාත්මක පරාමිතීන් සඳහා කළමනාකාරිත්වය නායකත්වය ලබා දෙයි. උපායමාර්ගික දෘෂ්ටියෙන් ගත්කළ, අස්වැන්න ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් ලෙස යහපත් කෘෂිකාර්මික සහ නිෂ්පාදන පරිවයන් සම්බන්ධයෙන් කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීමට හා දැනුම ඉහළ නැංවීමට හා එමගින් අවසාන නිෂ්පාදිතයට වඩා ඉහළ අධිමිලක් එක් කිරීමට සමාගම අදහස් කරයි. රන්දළු සමිති හඳුන්වාදීම මගින් කුඩා තේ වතු අංශය සමග යහපත් සබඳතා ඇති කර ගැනීමට සමාගම අදහස් කරන අතර කළුබෝවිටියාන සන්නාමය යටතේ දේශීය වෙළඳපොළ තුළ අලෙවිකිරීම අඛණ්ඩව සිදුකරයි. දැනුවත්බව හා අවබෝධය පුවල් කිරීමේ ක්‍රමයක් ලෙස, දැනුම වර්ධනය හා සමස්ත ඵලදායීතාවය වර්ධනය කිරීම පිණිස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සිය විධායක කාර්ය මණ්ඩලය සහ සේවකයන් සඳහා අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නියමිතය. ශක්තිමත් මූලධර්ම මත සමාගම අඛණ්ඩව සිය මෙහෙයුම් පවත්වාගෙන යන අතර සේවක පිරිස තම වටිනාම වත්කම සේ සලකයි.

අනාගත අපේක්ෂා

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය මුහුණ දුන් දුෂ්කරතා අතරින් අඩු රෝපණ අනුපාතිකය, අඩු ඵලදායීතාව, අධික නිෂ්පාදන පිරිවැය, තේ වගා කරන බිම් ප්‍රමාණය එකතැන රැඳීම හා හැකිළීම සහ ශ්‍රම ඌනතාවය ආදිය අවධාරණය කර තිබේ. තේ කර්මාන්තයේ අපනයන සහ නිෂ්පාදනයේ උච්චාවචනයන් සහ වඩාත් වැදගත් අප්‍රිකානු රටවල් සහ ඉන්දියාව අඩු පිරිවැයෙන් බහුලව තේ නිෂ්පාදනය කිරීමද ශ්‍රී ලංකාව මුහුණ පා ඇති අභියෝග අතර ප්‍රධාන වේ.

ඉහත සඳහන් සියලු සාධක සහ අනෙකුත් කරුණු, අනාගතය වෙනුවෙන් සැලසුම් කිරීමේදී වඩාත් වැදගත් ලෙස ඉදිරියේදී තේ දළු නෙලන්නන් නොමැතිවීම හේතුවෙන් කර්මාන්තය මුහුණ දෙන අති දුෂ්කර තත්ත්වය සැලකිල්ලට ගැනීම අවශ්‍ය වනු ඇත. එවැනි සැලැස්මකට ක්ෂණික, මැදි කාලීන සහ දිගු කාලීන ඉලක්ක සහ උපාය මාර්ග අන්තර්ගත විය යුතුය. මධ්‍ය හා දිගුකාලීනව ගත් කළ නව්‍යකරණය, යාන්ත්‍රීකරණය සඳහා අවස්ථා සහ වටිනාකම් එකතුකිරීම වැනි උපාය මාර්ග ශක්තිමත් අලෙවිකරණ උපායමාර්ග යක් සමගින් කර්මාන්තයේ පදනම සකස් කළ යුතු අතර ඒ සමගම හැකිතාක් දුරට වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා පවතින වත්මන් ක්‍රමවේද පවත්වා ගෙන යා යුතුය.

තේ කර්මාන්තයේ දීර්ඝ කාලීන අනාගතය නව්‍යකරණය සහ වෙනස්වන පාරිභෝගික රටා සහ ක්‍රමවේදයන්ට අනුවර්තනය වීම මත පරායත්ත වනු ඇත. තේ කර්මාන්තයේ සමස්ත අනුග්‍රාහක පිරිස රසඥයන් සුළු පිරිසකගෙන්ද, තේ ඇසුරුම් භාවිතයට ගන්නා පාරිභෝගිකයන්ගෙන්ද සමන්විත වන අතර කර්මාන්තයේ ආර්ථික අනාගතය සම්ප්‍රදායික තේ කෝප්පයක්, අයිස් තේ හෝ රසකළ තේ බවට පහසුවෙන් පත් කළ හැකි රසය හා ප්‍රියජනක සුවඳ සහිත තේ සාන්ද්‍රණය සහිත නිෂ්පාදනයක රඳා පවතිනු ඇත.

ස්තුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, අපගේ කටයුතුවල සාර්ථකත්වය සඳහා අප විශ්වාසය තබා කටයුතු කරන කුඩා තේ වතු හිමියන් මෙන්ම අපගේ මෙහෙයුම් සාර්ථකව අඛණ්ඩව ඉදිරියට මෙහෙයවන කළුබෝවිටියාන අපගේ කාර්ය මණ්ඩලය සහ කළමනාකාරිත්වය වෙත මාගේ ප්‍රසාදය පළකරමි. සැම අවස්ථාවකම අප වෙත උපදෙස් මාර්ගෝපදේශ ලබා දෙමින් දැක්වූ නොමසුරු සහයෝගය වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමාට සහ අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරීන්ට මෙන්ම කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ස්තුතිය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ තේ සඳහා නියම වටිනාකමක් නිරන්තරයෙන් ලබා දෙන සියලු තේ තැරැව්කාර සමාගම් සහ අපගේ නිෂ්පාදන මිලදී ගන්නන් ලබා දුන් සහයෝගය අප බෙහෙවින් අගය කරන්නෙමු. එළඹෙන වසර බොහෝ අංශවලින් අභියෝගවලින් පිරි එකක් වුවද, විශ්වාසයෙන් යුතුව ඉදිරියට යාමේ අධිෂ්ඨානය අප වෙත ලබා දෙන අපගේ සේවකයන්ගේ, පාර්ශවකරුවන් සහ ඔවුන්ගේ ශක්තිමත් හවුල්කාරිත්වයේ ශක්තිය හා පක්ෂපාතිත්වය පිළිබඳ මම විශ්වාසය තබන්නෙමි.



අමින්ද රොදිගෝ
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති	බී. කේ. අමින්ද උමේෂ් රොද්‍රිගෝ මයා
අධ්‍යක්ෂ	ඩබ්ලියු. ඒ. සුගතදාස මිය
අධ්‍යක්ෂ	එච්. හේමාල් කස්තුරිආරච්චි මයා
අධ්‍යක්ෂ	දොන් උපුල් අබේසුන්දර මයා
අධ්‍යක්ෂ	ඩබ්ලියු. කේ. බී. ටී. කුමාර අල්විස්
අධ්‍යක්ෂ	ජයන්ත විජේසිංහ මයා
අධ්‍යක්ෂ	ආර්. සී. ඩී. ජයවර්ධන මයා
අධ්‍යක්ෂ	ඩී. එම්. එම්. දිසානායක මයා

ආයතනික කළමනාකාරිත්වය

කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.	ආචාර්ය එම්.එන් ජයවර්ධන මහතා
කළමනාකරු/මූල්‍ය	එස්. ඒ. නිරෝෂා ලාලනී මිය
කළමනාකරු/පරිපාලන හා මානව සම්පත්	ටී. ඩබ්ලිව්. එම්. එස්. පී. බණ්ඩාර මහතා
සහකාර කළමනාකරු/මූල්‍ය	පී. දෙහිවලගේ මහතා
කළමනාකරු/කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව	ටී. ඒ. ඩී. ජේ. සී. තිලකරත්න මහතා
කළමනාකරු/දෑරංගල තේ කර්මාන්තශාලාව	එස්. ඒ. තුසිත මහතා
කළමනාකරු/හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව	එල්. ඒ. ඩී. ඩී. අයි. නන්දසිරි මහතා
කළමනාකරු/මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව	ආර්. ජේ. කේ. හෙට්ටිආරච්චි මහතා

සංවිධාන ව්‍යුහය



සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය
කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.
කළමනාකරු
(මානව සම්පත් හා පරිපාලන)
කළමනාකරු
(මූල්‍ය සහ අලෙවි)
සහකාර කළමනාකරු අලෙවි
සහකාර කළමනාකරු මූල්‍ය
අභ්‍යන්තර විගණන නිලධාරී
පරිපාලන නිලධාරී
අලෙවි නිලධාරී
තොරතුරු තාක්ෂණ සහකාර
කළමනාකරණ සහකාර
අලෙවි සහකාර
ගිණුම්/ කළමනාකරණ සහකාර
කළමනාකරණ අධ්‍යක්ෂකගේ පෞද්ගලික සහකාර
විගණන සහකාර
රියදුරු
කාර්යාල කාර්ය සහයක


කර්මාන්තශාලා කළමනාකරු
සහකාර කර්මාන්තශාලා කළමනාකරු
කර්මාන්තශාලා නිලධාරී
ප්‍රධාන ලිපිකරු
සභාපතිගේ පෞද්ගලික සහකාර
දළු ව්‍යාප්ති නිලධාරී
ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරු
විදුලි කාර්මික/කාර්මික
සහකාර කර්මාන්තශාලා නිලධාරී
සහකාර ලිපිකරු
ගබඩා භාරකරු
කණිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී
කණිෂ්ඨ සහකාර ලිපිකරු
මුරකරු
රියදුරු
දෛනික වැටුප්ලාභීන්



කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

මෙහෙයුම් තොරතුරු ____ 16
කර්මාන්තශාලා අනුව ලාභ/(අලාභ) ____ 18
මාසික තේ නිෂ්පාදනය ____ 19
වාර්ෂික තේ නිෂ්පාදනය ____ 20
මාසික දළු ලබාගැනීම් ____ 21
වාර්ෂික දළු ලබාගැනීම් ____ 22
සංසන්දනාත්මක විස්තර - නිෂ්පාදනය ____ 24
උන්නතාංශය සමග විකුණුම් සාමාන්‍ය සංසන්දනය ____ 26
ඉහළම මිල ගණන් – 2020/21 ____ 28
මූල්‍ය ප්‍රාග්ධනය ____ 29
මානව ප්‍රාග්ධනය ____ 30
සමාජ ප්‍රාග්ධනය ____ 31
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව ____ 32

මෙහෙයුම් තොරතුරු

ප්‍රධාන කාර්යාලය

ලිපිනය අංක 53, රත්නායක මාවත, පැලවත්ත, තලංගම දකුණ, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

මානව සම්පත්

කළමනාකාර අධ්‍යක්ෂ	–	1	අභ්‍යන්තර විගණන නිලධාරි	–	1
කළමනාකරු/පරිපාලන සහ මා.ස	–	1	ගිණුම් සහායක	–	2
කළමනාකරු මූල්‍ය	–	1	කළමනාකරණ සහායක	–	11
සහාය කළමනාකරු මූල්‍ය	–	1	කාර්යාල කාර්ය සහායක	–	3
සහාය කළමනාකරු/අලෙවි	–	1	රියදුරු	–	3



කළුබෝවිටියාන සිටිසි තේ කර්මාන්තශාලාව

දිස්ත්‍රික්කය	මාතර	**උප දිස්ත්‍රික්කය**	මොරවක
ගම	කළුබෝවිටියාන	**උන්නතාංශය**	පහතරට
වෙළඳ ලකුණ	කළුබෝවිටියාන	**නිෂ්පාදන වර්ගය**	සිටිසි තේ

මානව සම්පත්

කර්මාන්තශාලා කළමනාකරු	–	1	කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය	–	15
කාර්යාල කාර්ය මණ්ඩලය	–	6			



දෑරංගල තේ කර්මාන්තශාලාව

දිස්ත්‍රික්කය	මාතර	**උප දිස්ත්‍රික්කය**	මොරවක
ගම	කිරිවැල්කැලේ	**උන්නතාංශය**	පහතරට
වෙළඳ ලකුණ	දෑරංගල කිරිවැල්කැලේ	**නිෂ්පාදන වර්ගය**	සම්ප්‍රදායික තේ වර්ග

මානව සම්පත්

කර්මාන්තශාලා කළමනාකරු	–	1	කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය	–	10
කාර්යාල කාර්ය මණ්ඩලය	–	4			



හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව

දිස්ත්‍රික්කය	ගාල්ල	**උප දිස්ත්‍රික්කය**	තවලම
ගම	ජැස්මින් වැලි	**උන්නතාංශය**	පහතරට
වෙළඳ ලකුණ	හිනිදුම හිල්ස්/ තවලම හිල්ස්	**නිෂ්පාදන වර්ගය**	සම්ප්‍රදායික තේ වර්ග

මානව සම්පත්

කර්මාන්තශාලා කළමනාකරු	–	1	කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය	–	13
කාර්යාල කාර්ය මණ්ඩලය	–	4			



මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව

දිස්ත්‍රික්කය	මහනුවර	**උප දිස්ත්‍රික්කය**	යටිනුවර
ගම	මැණික්දිවෙල	**උන්නතාංශය**	බස්නාහිර මධ්‍ය
වෙළඳ ලකුණ	මැණික්දිවෙල	**නිෂ්පාදන වර්ගය**	සම්ප්‍රදායික තේ වර්ග

මානව සම්පත්

කර්මාන්තශාලා කළමනාකරු	–	1	කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය	–	8
කාර්යාල කාර්ය මණ්ඩලය	–	5			


මහනුවර
කොළඹ
ගාල්ල
මාතර

කර්මාන්තශාලා අනුව ලාභ/අලාභ

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

ප්‍රදේශයේ පැවැති අයහපත් කාලගුණික තත්වයන් මධ්‍යයේ වුවද, 2020/'21 මූල්‍ය වර්ෂය තුළදී කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව කි.ග්‍රෑ 4,375,283ක අමු දළු ප්‍රමාණයක් මිලදීගැනීමට සමත්වූ අතර එය මිලදීගැනීමට ඇස්තමේන්තු කළ එලදාව වූ කි. ග්‍රෑම් 4,650,000 න් 94.09% ක් ලෙස වාර්තා වුණි. පහතරට සහ සීටීසී තේ මිල ඉහළ යාමත් සමගින් නොවැළැක්විය හැකි පරිදි අමු දළු මිලදීගැනීම සඳහා කර්මාන්තශාලා අතර දැඩි තරඟකාරීත්වයක් පැවැති නමුත් 2020/'21 වර්ෂය තුලදීද අබණ්ඩව ප්‍රදේශයේ ඉහළම මිල ගෙවනු ලැබුයේ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව වන අතර එමගින් හොඳ තේ දළු අප කර්මාන්තශාලාව වෙත සපයන ලෙස කුඩා තේ වතු හිමියන්ගෙන් ඉල්ලා සිටින ලදී.

මූල්‍ය වර්ෂය තුළදී කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව රු.මිලියන 49.7 ක ලාභයක් වාර්තා කිරීමට සමත් විය.

තම කර්මාන්තශාලාවට කුඩා තේ වතු හිමියන් සැපයූ අමු දළු සඳහා සාධාරණ මිලක් ගෙවීම මගින් ඔවුන්ගේ ආදායම හා ජීවන මට්ටම ඉහළ නැංවීමට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව දායක විය.

දෑරංගල තේ කර්මාන්තශාලාව

ඇස්තමේන්තුගත දළු ප්‍රමාණය වූ කි.ග්‍රෑ. 2,160,000ට සාපේක්ෂව දෑරංගල තේ කර්මාන්තශාලාව කි.ග්‍රෑ. 1,517,906 ක දළු ප්‍රමාණයක් මිලදීගැනීමට සමත්වුවද, 2020/'21 මූල්‍ය වර්ෂය අවසානයේදී එය රු. මිලියන 9.2 ක අලාභයක් වාර්තා කරන ලදී. මෙම අයහපත් ප්‍රතිඵලය සඳහා බල පෑ එක් හේතුවක් වූයේ උසස් තත්වයේ අමු දළු සැපයුම සීමා වීමයි. එසේම එය සීමිත හා අනියෝගාත්මක විය. එසේම අපේක්ෂිත උසස් මට්ටමේ තේ දළු සඳහා කර්මාන්තශාලා අතර පැවැති තරඟකාරීත්වය ද මේ සඳහා හේතු විය.උසස් තත්ත්වයේ අමු දළු සපයා ගැනීමේදී කර්මාන්තශාලාව මුහුණ දුන් ගැටලු සඳහා කළමනාකාරීත්වය පිළියම් යොදන ලද අතර මෙම ඒකකයේ ලාභ ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා උපායමාර්ග සකස් කිරීමේ නිරතව සිටියි.

හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව

අයහපත් දේශගුණික තත්වයන් හේතු කොට ගෙන කර්මාන්තශාලාව දළු කිලෝ ග්‍රෑම් 1,577,904 ක් මිලදී ගත් අතර එය ඇස්තමේන්තුගත දළු ප්‍රමාණයෙන් 123.27% ක් විය. වර්ෂය තුළදී නව දළු සැපයුම් මාර්ග හඳුන්වාදීමට කර්මාන්තශාලා කළමනාකාරීත්වය උත්සාහ දැරූ අතර එමගින් ඉදිරි කාල සමයේදී ලබා ගන්නා දළු ප්‍රමාණය ඉහළ නැංවෙනු ඇත.

සමාගමේ අරමුණ වනුයේ උන්නතාංශ සාමාන්‍යයට ඉහළ ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් ලබා ගැනීම පිණිස ගුණාත්මක බවින් යුතු දළු පමණක් බාර ගැනීමයි.

මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව

අයහපත් දේශගුණික තත්වයන් හේතු කොට ගෙන කර්මාන්තශාලාව දළු කිලෝ ග්‍රෑම් 800,398 ක් මිලදී ගත් අතර එය ඇස්තමේන්තුගත දළු ප්‍රමාණයෙන් 63.52% ක් පමණි. මෙම වසරේදී සමාගම රු. මිලියන 19.6ක අලාභයක් වාර්තා කළ අතර ඒ සඳහා හේතු ගණනාවක් බලපාන ලදී. උසස් තත්ත්වයේ දළු ලබාගැනීමේ අපහසුතාව, තරඟකාරී අනෙකුත් කර්මාන්තශාලා විසින් ගෙවන ලද කෘතිම මිල ගණන් සහ සේවකයන්ට අවශ්‍ය නිපුණතා නොමැතිවීම ඒ අතුරින් කිහිපයක් වන අතර ඒවාට පිළියම් යෙදීමට කළමනාකාරීත්වය කටයුතු යොදමින් සිටී. ඉදිරි කාලයේදී සැලකිය යුතු මට්ටමේ නිමි තේ නිපදවීමට සහ ඒ සඳහා ඉහළ මිලක් ලබාගැනීමට හැකිවනු ඇති බවටත් එමගින් සමාගමට ලාභ ලබා ගැනීමට හැකිවනු ඇති බවටත් කළමනාකාරීත්වය සුබවාදී බලාපොරොත්තු තබා තිබේ.

වගුව - 03

	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (රුපියල්)	දෑරංගල තේ කර්මාන්තශාලාව (රුපියල්)	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (රුපියල්)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (රුපියල්)
ආදායම				
දළු විකුණුම්	649,038,260.00	203,705,580.00	209,035,610.00	78,175,940.00
තැරැව්කාර ගාස්තු හා විකුණුම් වියදම්	(7,627,805.57)	(3,231,653.91)	(3,391,513.84)	(1,400,194.45)
ශුද්ධ විකුණුම්	641,410,454.43	200,473,926.09	205,644,096.16	76,775,745.55
එකතු කළා - දේශීය විකුණුම්	20,023,636.90	5,764,128.49	2,478,455.24	3,129,836
මුළු ආදායම	661,434,091.33	206,238,054.58	208,122,551.40	79,905,581.55
විකුණුම් පිරිවැය				
මිලදී ගත් තේ දළු	466,296,828.09	158,180,301.64	168,259,179.97	64,583,463.46
නිෂ්පාදන පිරිවැය	85,769,564.21	38,808,993.16	35,195,716.56	23,230,431.25
පොදු ගාස්තු	32,621,828.19	19,696,690.87	13,680,460.42	16,829,550.51
	584,688,220.49	216,685,690.87	217,135,356.95	104,643,445.22
එකතු කළා: ආරම්භක තොග	86,368,094.06	29,427,930.94	21,005,153.96	5,821,026.00
අඩුකළා: අවසන් තොග	(59,276,319.90)	(30,719,791.20)	(24,418,236.64)	(10,984,858.61)
එකතුව	611,779,994.65	215,393,830.61	213,722,274.27	99,479,612.61
ලාභ/(අලාභ)	49,654,096.68	(9,155,776.03)	(5,599,722.87)	(19,574,031.06)

වගුව - 04

මාසය	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)	දෑරංගල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)	හිනිදුම තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)	එකතුව (කිලෝ ග්‍රෑම්)
අප්‍රේල් 2020	94,709	24,310	24,870	6,374	150,263
මැයි	86,229	19,338	27,881	18,581	152,029
ජූනි	74,479	20,815	28,229	10,508	134,031
ජූලි	66,792	28,406	30,916	27,383	153,497
අගෝස්තු	40,932	42,283	30,576	20,375	134,166
සැප්තැම්බර්	53,938	28,850	26,950	13,216	122,954
ඔක්තෝබර්	77,525	24,819	26,844	12,002	141,190
නොවැම්බර්	79,549	23,871	22,837	11,377	137,634
දෙසැම්බර්	98,883	27,626	27,738	8,168	162,415
ජනවාරි 2021	85,874	24,170	26,249	7,396	143,689
පෙබරවාරි	75,477	19,730	21,185	12,535	128,927
මාර්තු	82,190	30,172	27,380	15,593	155,335
එකතුව	916,577	314,390	321,655	163,508	1,716,130

ප්‍රස්තාරය - 07

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

(කිලෝ ග්‍රෑම්)



දෑරංගල තේ කර්මාන්තශාලාව

(කිලෝ ග්‍රෑම්)



හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව

(කිලෝ ග්‍රෑම්)



මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව

(කිලෝ ග්‍රෑම්)



වාර්ෂික තේ නිෂ්පාදනය

වගුව - 05

වර්ෂය	කළුබොච්චියාන තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)	දෑරංගල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)	නිනිදුම තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)	එකතුව (කිලෝ ග්‍රෑම්)
1994/95	536,780	–	–	–	536,780
1995/96	1,038,739	–	–	–	1,038,739
1996/97	1,082,973	–	–	–	1,082,973
1997/98	1,194,418	–	–	–	1,194,418
1998/99	809,741	–	–	–	809,741
1999/02	884,197	14,584	–	–	898,781
2000/01	914,433	494,894	–	–	1,409,327
2001/02	954,905	536,601	–	–	1,491,506
2002/03	1,039,447	636,762	–	–	1,676,209
2003/04	1,154,969	488,915	–	–	1,643,884
2004/05	1,173,659	361,154	–	–	1,534,813
2005/06	1,161,031	348,651	–	–	1,509,682
2006/07	1,272,903	278,828	–	–	1,551,731
2007/08	1,097,681	320,512	–	–	1,418,193
2008/09	967,631	227,617	–	–	1,195,248
2009/10	950,347	222,824	–	–	1,173,171
2010/11	994,746	269,314	–	–	1,264,060
2011/12	1,170,972	240,901	–	–	1,411,873
2012/13	1,110,907	254,706	168,425	–	1,534,038
2013/14	995,844	281,666	146,031	–	1,423,541
2014/15	943,706	315,854	171,751	–	1,431,311
2015/16	994,541	460,860	219,765	117,017	1,792,183
2016/17	811,708	429,382	253,157	209,464	1,703,711
2017/18	731,750	289,634	242,955	210,107	1,474,446
2018/19	807,843	276,186	174,272	202,120	1,460,421
2019/20	900,125	290,262	138,805	125,078	1,454,270
2020/21	916,577	314,390	321,655	163,508	1,716,130
එකතුව	26,612,573	7,354,497	1,836,816	1,027,294	36,831,179

ප්‍රස්තාර - 08

සමාගමේ වාර්ෂික තේ නිෂ්පාදනය

(කිලෝ ග්‍රෑම් මිලියන)



වගුව - 06

මාසය	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව		දෑරංගල තේ කර්මාන්තශාලාව		හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව		මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව		එකතුව	
	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)
අප්‍රේල් 2020	2,342	438,622	801	119,638	156	121,199	251	30,501	3,550	709,960
මැයි	2,322	396,234	802	95,065	159	137,345	282	92,589	3,565	721,233
ජූනි	2,295	364,227	795	101,437	152	138,756	259	50,394	3,501	654,814
ජූලි	2,304	326,410	792	139,240	158	153,008	264	132,046	3,518	750,704
අගෝස්තු	2,260	197,275	789	202,863	159	145,996	266	98,238	3,474	644,372
සැප්තැම්බර්	2,244	269,040	793	140,044	158	123,750	266	64,095	3,461	596,929
ඔක්තෝබර්	2,240	369,092	805	119,209	145	131,587	266	58,090	3,456	677,978
නොවැම්බර්	2,309	385,976	800	114,483	148	113,821	266	56,298	3,523	670,578
දෙසැම්බර්	2,359	472,589	790	131,489	154	135,303	253	54,275	3,556	793,656
ජනවාරි 2021	2,361	412,605	787	114,890	159	130,913	230	34,277	3,537	692,685
පෙබරවාරි	2,329	360,374	771	93,803	157	104,863	263	57,904	3,520	616,944
මාර්තු	2,423	382,877	784	145,745	159	141,363	292	71,691	3,658	741,676
එකතුව		4,375,321		1,517,906		1,577,904		800,398		8,271,529
සාමාන්‍ය		364,610		126,492		131,492		66,698		689,294

ප්‍රස්තාර - 09

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

(කිලෝ ග්‍රෑම්)



දෑරංගල තේ කර්මාන්තශාලාව

(කිලෝ ග්‍රෑම්)



හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව

(කිලෝ ග්‍රෑම්)



මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව

(කිලෝ ග්‍රෑම්)



වාර්ෂික අමු තේ දළු ලබාගැනීම

වර්ෂය	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව			දෑරංගල තේ කර්මාන්තශාලාව		
	ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	ගාස්තුව (රු.)	ගෙවූ මිල (රු.)	ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	ගාස්තුව (රු.)	ගෙවූ මිල (රු.)
1994/95	2,539,978	11.65	29,590,743.70	–	–	–
1995/96	4,758,850	13.50	64,244,475.00	–	–	–
1996/97	5,011,298	16.76	83,989,354.48	–	–	–
1997/98	5,619,161	21.49	120,755,769.89	–	–	–
1998/99	3,764,498	20.99	79,016,813.02	–	–	–
1999/02	4,092,958	20.54	84,069,357.32	68,377	21.00	1,435,917.00
2000/01	4,225,019	24.73	104,484,719.87	2,283,999	23.21	53,011,616.79
2001/02	4,406,549	25.76	113,512,702.24	2,452,187	23.33	57,209,522.71
2002/03	4,779,581	27.06	129,335,461.86	3,042,878	22.67	68,982,044.26
2003/04	5,316,428	29.28	155,665,011.84	2,274,012	23.82	54,166,965.84
2004/05	5,464,753	34.08	186,238,782.24	1,727,312	27.70	47,846,542.40
2005/06	5,362,732	36.30	194,667,171.60	1,688,298	29.11	49,146,354.78
2006/07	5,859,734	38.42	225,130,980.28	1,339,562	32.27	43,227,665.74
2007/08	5,061,084	51.08	258,520,170.72	1,559,138	46.92	73,154,754.96
2008/09	4,455,756	53.57	238,694,848.92	1,129,629	46.22	52,211,452.38
2009/10	4,406,749	62.56	275,686,217.44	1,114,004	57.22	63,743,308.88
2010/11	4,634,137	66.28	307,150,600.36	1,359,341	59.29	80,595,327.89
2011/12	5,421,437	69.59	377,277,800.83	1,136,937	58.20	66,169,733.40
2012/13	5,161,301	71.16	367,278,179.16	1,243,421	64.55	80,262,825.55
2013/14	4,638,578	80.13	371,689,255.14	1,386,298	74.78	103,667,364.44
2014/15	4,446,200	76.98	342,268,476.00	1,539,561	72.58	111,741,337.38
2015/16	4,774,872	65.72	313,804,587.84	2,249,785	61.38	138,091,803.30
2016/17	3,941,813	83.23	328,077,095.99	2,113,499	81.96	173,222,378.04
2017/18	3,499,414	104.54	365,828,739.56	1,474,475	99.04	146,032,004.00
2018/19	3,855,520	95.15	366,852,728.00	1,342,705	93.50	125,542,917.50
2019/20	4,237,689	100.86	427,413,312.54	1,399,915	89.68	125,544,377.20
2020/21	4,375,321	106.57	466,277,958.97	1,517,906	104.20	158,165,805.20

වගුව - 07

	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව			මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව		
	ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	ගාස්තුව (රු.)	ගෙවූ මිල (රු.)	ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	ගාස්තුව (රු.)	ගෙවූ මිල (රු.)
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	–	–	–	–	–	–
	838,887	65.05	54,569,599.35	–	–	–
	731,251	75.77	55,406,888.27	–	–	–
	834,380	72.15	60,200,517.00	–	–	–
	1,095,511	59.45	65,128,128.95	542,106	58.76	31,854,148.56
	1,235,080	81.32	100,436,705.60	1,033,573	67.62	69,890,206.26
	1,224,781	96.96	118,754,765.76	1,097,625	82.89	90,982,136.25
	875,077	91.23	79,833,274.71	1,023,085	73.86	75,565,058.10
	683,988	91.72	62,735,379.36	625,482	66.76	41,757,178.32
	1,577,904	106.63	168,251,903.52	800,398	80.68	64,576,110.64

පහතරට සි.ටී.සී. සහ ජාතික සි.ටී.සී. තේ නිෂ්පාදනයට සපයනු ලැබූ දායකත්වය

වගුව - 08

මාසය	සි.ටී.සී.		කළුබෝවිටියාන නිෂ්පාදනය*	නිෂ්පාදනය සඳහා දායකත්වය	
	පහත රට (කිලෝ ග්‍රෑම් '000)	ජාතික (කිලෝ ග්‍රෑම් '000)	(කිලෝ ග්‍රෑම් '000)	පහත රට (%)	ජාතික (%)
අප්‍රේල් 2020	862	1,692	94.71	10.99	5.60
මැයි	874	2,409	86.23	9.87	3.58
ජූනි	906	2,333	74.48	8.22	3.19
ජූලි	891	2,183	66.79	7.50	3.06
අගෝස්තු	757	1,675	40.93	5.41	2.44
සැප්තැම්බර්	778	1,693	53.94	6.93	3.19
ඔක්තෝබර්	867	1,796	77.53	8.94	4.32
නොවැම්බර්	960	2,249	79.55	8.29	3.54
දෙසැම්බර්	1,171	2,723	98.88	8.44	3.63
ජනවාරි 2021	980	2,047	85.87	8.76	4.20
පෙබරවාරි	935	2,072	75.48	8.07	3.64
මාර්තු	1,101	2,458	82.19	7.47	3.34
එකතුව	11,082	25,330	916.58	8.27	3.62

* කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

පහතරට සම්ප්‍රදායික නිෂ්පාදනය සහ ජාතික සම්ප්‍රදායික නිෂ්පාදනය සඳහා දායකත්වය

වගුව - 09

මාසය	සම්ප්‍රදායික නිෂ්පාදනය			නිෂ්පාදනය		නිෂ්පාදනය සඳහා දායකත්වය		
	පහත රට (කිලෝ ග්‍රෑම් '000)	මධ්‍ය (කිලෝ ග්‍රෑම් '000)	ජාතික (කිලෝ ග්‍රෑම් '000)	දැ.තේ.ක*/ හි.හි.ක** (කිලෝ ග්‍රෑම් '000)	මැ.තේ.ක*** (කිලෝ ග්‍රෑම් '000)	පහත රට (%)	මධ්‍ය (%)	ජාතික (%)
අප්‍රේල් 2020	12,423	2,473	18,498	49.2	6.4	0.40	0.26	0.27
මැයි	14,796	4,888	25,814	47.2	18.6	0.32	0.38	0.27
ජූනි	14,417	3,342	24,346	49.0	10.5	0.34	0.31	0.24
ජූලි	15,253	3,390	23,920	59.3	27.4	0.39	0.81	0.36
අගෝස්තු	14,112	2,758	20,575	72.9	20.4	0.52	0.74	0.45
සැප්තැම්බර්	13,482	2,784	20,017	55.8	13.2	0.41	0.47	0.34
ඔක්තෝබර්	14,533	2,803	21,442	51.7	12.0	0.36	0.43	0.30
නොවැම්බර්	14,218	3,251	22,336	46.7	11.4	0.33	0.35	0.26
දෙසැම්බර්	16,150	3,642	25,594	55.4	8.2	0.34	0.22	0.24
ජනවාරි 2021	13,931	2,613	20,830	50.4	7.4	0.36	0.28	0.28
පෙබරවාරි	13,265	2,848	20,142	40.9	12.5	0.31	0.44	0.27
මාර්තු	15,828	4,030	25,706	57.6	15.6	0.36	0.39	0.28
එකතුව	172,408	38,822	269,220	636.0	163.5	0.37	0.42	0.30

* දෑරංගල තේ කර්මාන්තශාලාව ** හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව *** මැණික්දිවෙලතේ කර්මාන්තශාලාව

සමාගම අනුව පහතරට තේ නිෂ්පාදනය සහ ජාතික තේ නිෂ්පාදනය සඳහා දායකත්වය

වගුව - 10

මාසය	සමස්ත නිෂ්පාදනය			සමාගමේ මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් '000)	නිෂ්පාදනය සඳහා දායකත්වය		
	පහත රට (කිලෝ ග්‍රෑම් '000)	මධ්‍ය (කිලෝ ග්‍රෑම් '000)	ජාතික (කිලෝ ග්‍රෑම් '000)		පහත රට (%)	මධ්‍ය (%)	ජාතික (%)
අප්‍රේල් 2020	13,285	2,473	20,190	145.3	1.09	0.26	0.72
මැයි	15,670	4,888	28,223	157.0	1.00	0.38	0.56
ජූනි	15,323	3,342	26,679	134.0	0.87	0.31	0.50
ජූලි	16,144	3,390	26,103	153.5	0.95	0.81	0.59
අගෝස්තු	14,869	2,758	22,250	134.2	0.90	0.74	0.60
සැප්තැම්බර්	14,260	2,784	21,710	123.0	0.86	0.47	0.57
ඔක්තෝබර්	15,400	2,803	23,238	141.2	0.92	0.43	0.61
නොවැම්බර්	15,178	3,251	24,585	137.6	0.91	0.35	0.56
දෙසැම්බර්	17,321	3,642	28,317	161.1	0.93	0.22	0.57
ජනවාරි 2021	14,911	2,613	22,877	143.7	0.96	0.28	0.63
පෙබරවාරි	14,200	2,848	22,214	128.9	0.91	0.44	0.58
මාර්තු	16,929	4,030	28,164	155.3	0.92	0.39	0.55
එකතුව	183,490	38,822	294,550	1,714.7	0.93	0.42	0.63

විකුණුම් සාමාන්‍යය උන්නතාංශ සමඟ සැසඳුම

පහතරට උන්නතාංශ සාමාන්‍යය සමඟ සැසඳුම

වගුව - 11

මාසය	පහතරට සාමාන්‍යය (රු.)	විකිණුම් සාමාන්‍යය					
		කළුබෝවිටියාන (රු.)	විචලනය	දෑරංගල (රු.)	විචලනය	හිනිදුම (රු.)	විචලනය
අප්‍රේල් 2020	744.66	795.02	50.36	764.91	20.25	838.91	94.25
මැයි	745.82	766.24	20.42	793.63	47.81	794.65	48.83
ජූනි	657.45	615.84	(41.61)	672.16	14.71	684.01	26.56
ජූලි	669.87	600.88	(68.99)	698.04	28.17	713.31	43.44
අගෝස්තු	666.97	624.64	(42.33)	704.31	37.34	718.78	51.81
සැප්තැම්බර්	663.13	695.45	32.32	729.79	66.66	713.88	50.75
ඔක්තෝබර්	679.99	792.50	112.51	731.06	51.07	717.82	37.83
නොවැම්බර්	665.25	794.41	129.16	703.20	37.95	708.42	43.17
දෙසැම්බර්	663.03	789.27	126.24	680.15	17.12	688.68	25.65
ජනවාරි 2021	673.60	783.35	109.75	688.80	15.20	705.64	32.04
පෙබරවාරි	675.10	726.21	51.11	691.42	16.32	699.42	24.32
මාර්තු	677.26	650.57	(26.69)	613.64	(63.62)	604.44	(72.82)

ප්‍රස්තාර - 10

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව – පහතරට උන්නතාංශ සාමාන්‍යය සමඟ සැසඳුම (රු.)



දෑරංගල තේ කර්මාන්තශාලාව – පහතරට උන්නතාංශ සාමාන්‍යය සමඟ සැසඳුම (රු.)



හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව – පහතරට උන්නතාංශ සාමාන්‍යය සමඟ සැසඳුම (රු.)



මධ්‍යම වගා උන්නතාංශ සාමාන්‍යය සමග සැසඳුම

වගුව - 12

මාසය	මධ්‍යම වගා සාමාන්‍යය (රු.)	විකිණුම් සාමාන්‍යය	
		මැණික්දිවෙල (රු.)	විචලනය
අප්‍රේල් 2020	596.70	520.13	(76.57)
මැයි	587.67	598.28	10.61
ජූනි	541.64	566.65	25.01
ජූලි	515.38	546.04	30.66
අගෝස්තු	545.96	559.87	13.91
සැප්තැම්බර්	537.45	565.91	28.46
ඔක්තෝබර්	565.62	507.81	(57.81)
නොවැම්බර්	555.83	501.82	(54.01)
දෙසැම්බර්	581.32	476.31	(105.01)
ජනවාරි 2021	588.33	465.73	(122.60)
පෙබරවාරි	593.30	543.92	(49.38)
මාර්තු	617.05	588.29	(28.76)

ප්‍රස්තාර - 11

මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව – මධ්‍යම වගා උන්නතාංශ සාමාන්‍යය සමග සැසඳුම (රු.)



ඉහළම මිල ගණන් සහ කාර්යසාධනය 2020/21

වගුව - 13

විකුණුම් දිනය	විකුණුම් අංකය	PF1			P-Dust			BP1		
		තැරැව්කරු	ඉන්වොයිසි අංකය	මිල	තැරැව්කරු	ඉන්වොයිසි අංකය	මිල	තැරැව්කරු	ඉන්වොයිසි අංකය	මිල
4/18/2020	14	ජෝන් කීල්ස්	587, 588	830.00						
4/18/2020	14	ෆෝබ්ස්	581	830.00						
4/18/2020	14	බාට්ලිට්	583, 584	830.00						
4/18/2020	14	ඒෂියා	585	830.00						
4/18/2020	14	ම(ර්)කන්ටයිල්	586	830.00						
5/6/2020	17	එල්සීබීඑල්	631	860.00						
5/14/2020	18	ෆෝබ්ස්	7	860.00	බාට්ලිට්	622	720.00			
5/14/2020	18				ම(ර්)කන්ටයිල්	621	720.00			
7/1/2020	25				ම(ර්)කන්ටයිල්	68	560.00			
7/15/2020	27	සීටීබී	153	650.00	බාට්ලිට්	169	650.00			
7/15/2020	27	එල්සීබීඑල්	171	650.00						
7/22/2020	28	ජෝන් කීල්ස්	179, 180	620.00						
7/29/2020	29	ෆෝබ්ස්	194	640.00	ෆෝබ්ස්	145	760.00			
8/5/2020	30	ජෝන් කීල්ස්	200	630.00						
8/5/2020	30	ම(ර්)කන්ටයිල්	201	630.00						
8/12/2020	31	ඒෂියා	217	630.00			820.00			
9/2/2020					බාට්ලිට්	271	640.00			
9/9/2020					බාට්ලිට්	280	750.00			
9/16/2020								එල්සීබීඑල්	294	690.00
12/9/2020	48				බාට්ලිට්	428	770.00			
12/16/2020	19				බාට්ලිට්	458	780.00			
12/22/2020	50	එල්සීබීඑල්	466	840.00						
12/22/2020	50	සීටීබී	468	840.00						
2/2/2021	5				බාට්ලිට්	559	660.00			
2/17/2021	7				බාට්ලිට්	595	790.00			

ආදායම් විශ්ලේෂණය

ඉකුත් මූල්‍ය වසරේ ඉපැයූ රු. මිලියන 938 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමාගම වාර්තා කළ දළ ආදායම රු. මිලියන 1,176 ක් වූ අතර එය පෙර වසර හා සැසඳීමේදී 25.4%ක වර්ධනයක් පෙන්නුම් කරයි. එලදා නිමැවුම සඳහා බලපෑ අහිතකර කාලගුණය, රුසියාවේ ඇතැම් ගැනුම්කරුවන් කෙන්යාවෙන් සීටීසී තේ මිලට ගැනීම සඳහා යොමුවීම සහ තම තේ හැකිතාක් දුරට කුඩා තේ වතු අංශයෙන් ලබාගැනීම සඳහා තේ කර්මාන්තශාලා අතර පැවැති දැඩි තරඟකාරිත්වය පෙර වසරේ මෙන්ම මේ වසරේදී ද පැවැති ප්‍රධාන අභියෝග විය.

රටේ පැවැති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පෙර වසරේ රු. මිලියන 25.14ක් වූ දේශීය විකුණුම් මෙම වසරේදී රු. මිලියන 20 දක්වා අඩු විය.

විකුණුම් පිරිවැය හා මෙහෙයුම් වියදම්

රු. මිලියන 1,158ක් වූ විකුණුම් පිරිවැය පෙර මූල්‍ය වසරට සාපේක්ෂව 37% ක ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. වසර තුළ අමු දළු පිරිවැය සහ නිෂ්පාදන පිරිවැය වැඩි විය. තම පොදු කාර්ය පිරිවැය අඩුකර ගැනීමට සමාගම සමත් විය.

බහුවිධ වියදම් සංරචකයන්ගේ ඉහළයාමට අනුකූලව පරිපාලන වියදම් ඉකුත් වසරේ රු. මිලියන 50.7 ට සාපේක්ෂව රු. මිලියන 43.9ක් දක්වා දක්වා අඩු විය.

අනෙකුත් මෙහෙයුම් ආදායම

අනෙකුත් මෙහෙයුම් ආදායම, ඉකුත් මූල්‍ය වසරේ වාර්තා වූ රු. මිලියන 7.2 සිට රු.මිලියන 15.2 දක්වා අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් ලාබය පූර්ව වසරේ වාර්තා වූ රු. මිලියන 48.1 සිට රු. මිලියන 12.4 දක්වා අඩුවිය.

මූල්‍ය පිරිවැය

වර්ෂය තුලදී සමාගමේ මූල්‍ය වියදම් රු. මිලියන 14.1ක් වුණි. ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළදී සමාගම රු. මිලියන 11.5 ක පොළී ආදායමක් උපයන ලදී. 2003 වසරේදී බීසීසී ලංකා ආයතනය වෙත සමාගම ලබාදුන් ණය ශේෂ පත්‍රයේ දිගටම පැවැති අතර එමගින් සමාගමට පොළී ආදායමක් උත්පාදනය වුණි.

මූල්‍ය තත්වය හා ද්‍රවශීලතාව

ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම්, මුළු වත්කම් පදනමින් 28.2% කින් සමන්විත විය. සමාලෝචිත මුදල් වර්ෂය තුළදී සමාගම පිරියත හා යන්ත්‍රෝපකරණ, පරිගණක උපකරණ, ලී බඩු සහ සවිකිරීම් සඳහා ආයෝජනය කරන ලද මුදල රු. මිලියන 9.2 කි.

ණය - බීසීසී ලංකා සමාගම

2004 වසරේදී බීසීසී ලංකා සමාගම වෙත ලබාදෙන ලද රු. මිලියන 10 ක ණය මුදල හා ඒ සඳහා සමුච්චිත පොළිය වන රු. මිලියන 48.4 (මුළු මුදල රු. මිලියන 58.4) ආපසු අයකර ගැනීම සඳහා සමාගම ප්‍රයත්න කිහිපයක් දැරුවද ඒ කිසිවක් සාර්ථක නොවීය.

කාරක ප්‍රාග්ධනය

වර්ෂය තුළදී සමාගමේ ජංගම වත්කම් පෙර වසරේ පැවැති රු. මිලියන 429.6 සිට රු. මිලියන 443.8 දක්වා ඉහළ නැංවුණි. තොග භාණ්ඩ රු. මිලියන 164.3 සිට රු. මිලියන 149 දක්වා අඩු විය. වෙළඳ ගෙවිය යුතු ද්‍රී ප්‍රමාණය පෙර වසරේ රු. මිලියන 62.01 සිට රු. මිලියන 83.5 දක්වා වැඩි විය. බැංකු අයිරාව පෙර වසරේ පැවැති රු. මිලියන 87.10 සිට රු. මිලියන 63 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. එබැවින් සමාගම සිය කාරක ප්‍රාග්ධන චක්‍රය සතුටුදායක සීමාවන් තුළ කළමනාකරණය කරගන්නා ලදී.

ප්‍රාග්ධන ව්‍යුහය

සාමාන්‍ය කොටස් ප්‍රමාණය

සමාගම රු. 46,375,070.00 ක වටිනාකමක් සහිත සාමාන්‍ය ප්‍රාග්ධන කොටස් නිකුත් කරන ලදී. ඉදිරියට රැගෙන ආ ලාභ මගින් සමාලෝචිත මුදල් වර්ෂය සඳහා රඳවාගත් ඉපැයුම් හා සංචිත ඉහළ නංවන ලදී.

ණය ගැනිම්

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දුෂ්කරතාවයට පත්වූ ව්‍යාපාරවලට උපකාර කිරීම පිණිස සමාගම 4% පොළී අනුපාතයට රු මිලියන 18.5ක් වූ කාරක ප්‍රාග්ධන ණයක් මහජන බැංකුවෙන් ලබා ගන්නා ලදී.

මානව ප්‍රාග්ධනය

පුහුණුව සහ සංවර්ධනය

මානව ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා වන අපගේ ප්‍රයත්නයේ පදනම වනුයේ පුහුණුව හා සංවර්ධනයයි. කළමනාකාරිත්වය අඛණ්ඩව කුසලතා ඌනතා ඇගයීමට ලක් කර, නිත්‍ය කාල අන්තර තුළ කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය සහතික කිරීම පිණිස කුසලතා ඇගයීමේ ප්‍රතිඵල අනුව පුහුණු සහ සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේදී, කාර්ය මණ්ඩලයේ වෘත්තීමය සහ තාක්ෂණික කුසලතා ප්‍රවර්ධනය පිණිස සමාගම සිය සේවකයන් සඳහා විවිධ පුහුණු අවස්ථා පිරිනමන ලදී.

අපගේ සේවකයන්ගේ පුහුණුව සහ සංවර්ධනය සඳහා අනුගමනය කළ එක් වැදගත්ම ක්‍රමවේදයක් වනුයේ කාර්යස්ථ පුහුණුවයි. තවද, සමාගමේ බහුවිධ අංශයන්හි කටයුතු කිරීමට හැකිවන පරිදි අප කාර්ය ඕණඩලය සවිබල ගැන්වීම පිණිස ඔවුන්ට තීරයක් පුහුණුව ලබා දෙන ලදී. එවැනි හැකියා වර්ධන ක්‍රියා පටිපාටි සමාගමේ නම්‍යතාවය ඉහළ නංවා ඇති අතර කුසලතා උපයෝජනයෙන් සහ උපරිමායනයෙන් වාසි සලසා ගැනීමට හැකියාව ඇතිකර තිබේ. අපගේ සේවකයන්ට සමාගම හරහා සංචලතාව සඳහා අවස්ථා කිහිපයක් ලබා දී ඇති අතර වෘත්තීය සංවර්ධන ඉඩප්‍රස්තා සඳහා ප්‍රමුඛතාව ලබා දී තිබේ.

විධායක නිලධාරීන්/කාර්ය මණ්ඩලය/සේවකයන් සඳහා වසර තුලදී පුහුණු වැඩසටහන්

- කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කාර්ය මණ්ඩල පුහුණුව (ජාතික වැවිලි කළමනාකරණ ආයතනය)
- 2021 අයවැය පිළිබඳව විධායක කාර්ය මණ්ඩලය සඳහා සම්මන්ත්‍රණය (කොළඹ කොටස් වෙළඳපොළ)

ප්‍රාග්ධන ආයෝජන

තම තරඟකාරිත්වය පවත්වා ගැනීම පිණිස පද්ධති, ක්‍රියාදාම සහ යටිතල පහසුකම්වල ධාරිතා ඉහළ නැංවීම සමාගම කලින් කලට සිදුකරයි. සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධයෙන් ව්‍යාපෘති කිහිපයක් සිදු කළ අතර ඒවා පහත දැක්වේ.

- කළුබෝවිටියාන කර්මාන්තශාලාව සඳහා රු. මිලියන 2.7ක් වටිනා පිරියත හා යන්ත්‍රෝපකරණ ලබා ගන්නා ලදී.
- හිනිදුම තේ කර්මාන්තශාලාව සඳහා රු. මිලියන 1 ක් වටිනා පිරියත හා යන්ත්‍රෝපකරණ ලබා ගන්නා ලදී.
- වර්ෂය තුළදී ගොඩනැගිලි අළුත්වැඩියා සහ නව කොටස් එකතු කිරීම වෙනුවෙන් රු. මිලියන 2.2 ක් වැය කරන ලදී.

කුඩා තේ වතු හිමියන්, කාර්ය මණ්ඩලය සහ සේවකයන් තම ප්‍රධානතම පාර්ශවකරුවන් ලෙස සමාගම සලකන අතර එම වටිනා පාර්ශවකරුවන් සමග සමීපව දිගටම කටයුතු කරන බවට සහතික වෙයි. තම පාර්ශවකරුවන් සමග දැඩි සමීපතාවකින් කටයුතු කිරීමෙන් අදහස් වනුයේ ඔවුන් මුහුණ දෙන අභියෝග සමාගම අවබෝධ කරගන්නා බවත් පාර්ශවකරුවන්ගේ ප්‍රතිලාභය සහ ඔවුන් නගා සිටුවීම සඳහා ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති ගණනාවක් පවත්වා ඇති බවත්ය.

සෞඛ්‍ය ආරක්ෂණය

සමාගමේ පාර්ශවකරුවන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම අවධානය යොමු කරන මූලික කරුණක් වන අතර සෑම වසරකම ඔවුන්ගේ ප්‍රතිලාභය සඳහා ව්‍යාපෘති කිහිපයක් ඉටු කරනු ලැබේ. ඒවා පහත පරිදිය.

- ගර්භණී සායන සඳහා දිවා ආහාර සැපයීම.

අධ්‍යාපනික සහ ආගමික ව්‍යාපෘති සහ අනෙකුතු ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

- අපගේ සියලු පාර්ශවකරුවන්ගේ සුබසාධනය සඳහා තත්ත්ව ප්‍රමිති වැඩි දියුණු කිරීම පිණිස රන්දළු සුබසාධක සමිතිය පිහිටුවනු ලැබීය.
- කුඩා තේ වතු හිමියන් සඳහා තේ වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් කර්මාන්තශාලා හතරෙහිම පවත්වනු ලැබීය.
- අප ජනතාවගේ ආගමික නැඹුරුව සිත්හි ධාරණය කර ගනිමින්, ආගම තම පාර්ශවකරුවන්ගේ ජීවිතවල වැදගත් භූමිකාවක් ඉටුකරන බවට සමාගම අවබෝධයෙන් සිටින බැවින්, කාර්ය මණ්ඩලය සහ සේවකයන් සඳහා එය වන්දනා ගමන් සංවිධානය කිරීම මගින් ඒ සඳහා පහසුකම් සපයයි.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2021 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ කටයුතු පිළිබඳ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ව්‍යාපාරයේ ස්වභාවය

සමාගම ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වනුයේ වගාකරුවන්ගෙන් මිලදි ගත් තේ දළු පිරියම් කිරීමේ, කල් තබා ගත හැකි ලෙස සකස් කිරීමේ, පිළියෙල කිරීමේ, පිරිසැකසුම් කිරීමේ සහ අලෙවි කිරීමේ නිරත වීම සහ තේ වගා කිරීම, සිටුවීම සහ තේ වතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම වේ.

සමාගමේ කාර්යසාධනය

වාර්ෂික වාර්තාවේ කොටසක් සම්පාදනය කරන්නා වූ විගණන වාර්තාව ද ඇතුළුව (මීට අමුණා ඇති) මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ අදහස් දැක්වීම් සහිතව වර්ෂය තුළ සමාගමේ කටයුතු සහ එහි කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය මූල්‍ය ප්‍රකාශනයන්හි අන්තර්ගත වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 04 සිට 12 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්වල දක්වා තිබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

සමාගම විසින් පෙර වසරවල අනුගමනය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල කිසිදු වෙනසක් නොමැතිව සංගතව ආදේශ කර තිබේ.

පොළී ලේඛනයේ ඇතුළත් කළ සටහන්

පොළී ලේඛනයේ ඇතුළත් කළ සටහන් 23 වන පිටුවේ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු යන මාතෘකාව යටතේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල හෙළදරව් කොට ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිලාභ

2021 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි 15 වන පිටුවෙහි විස්තර කොට ඇත.

පරිත්‍යාග

සමාලෝචිත මුදල් වර්ෂය තුළ පරිත්‍යාග සිදු කර නොමැත.

සමාගමේ අධ්‍යක්ෂවරු

2021 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා සමාගමේ අධ්‍යක්ෂවරු පහත දැක්වෙන පරිදි වේ.

ඒ. රොද්‍රිගෝ මහතා
අයි. සුගතදාස මිය
කේ. එච්. හේමපාල මයා
පී. එස්. එම්. සේනාධීර මයා
ජේ. විජේසිංහ මයා
ඩී. යූ. අබේසුන්දර මයා
ඩබ්. ඒ. කේ. බී. ටී. කේ.අල්විස් මයා
ආර්. සී. ඩී. ජයවර්ධන මයා

විගණන ගාස්තු

සමාලෝචිත මූල්‍ය වර්ෂය සඳහා විගණකවරුන්ගේ ගාස්තුව රු. 1,203,300.00 කි.

විගණකවරු ලෙස හැර විගණකවරුන්ට සමාගම සමග ඇති බැඳියාව

තම ස්වාධීන්තවයට හානි වන කිසිදු සබඳතාවක් හෝ බැඳියාවක් විගණකවරුන් සමාගම කෙරෙහි නොමැති බවට අධ්‍යක්ෂවරුන් සැහීමකට පත්වේ.



සභාපති



අධ්‍යක්ෂ



සමාගමේ ලේකම්

2021 නොවැම්බර් 29 වන දිනදීය.

මූල්‍ය වාර්තා

විගණක වාර්තාව ____ 34

ලාභ/(අලාභ) සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය ____ 38

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ____ 39

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය ____ 40

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ____ 41

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති ____ 42

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ____ 47

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන ____ 60

පූර්ව වසර දහය තුළ විශේෂ මූල්‍ය සිදුවීම් ____ 66

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PLA/B/KTFL/01/2020/21/11

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 නොවැම්බර් 15 දින

සභාපති
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාග මේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බදු ගෙවීමක් හෝ නැවත අයකරග ැනීමක් සිදුවී නොමැති වුවත් රු. 4,162,195 ක් වූ ආදායම් බදු ලැබීමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පීව විද්‍යාත්මක වත්කම් අත්පත් කර ගැනීම සඳහා මුදලින් දරන ලද රු. 1,333,382 ක මුදල දැක්විය යුතු වුවත්, සදොස් ලෙස එහි වාර්ෂික ක්ෂය අඩුකළ වටිනාකම වූ රු. 1, 228, 538 ක් වත්කම් අත්පත් කර ගැනීම් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාගම විසින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු. 240,350,688 ක් වූ පිරියත හා උපකරණ, ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ හා මෝටර් වාහන යනාදී වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම වත්කම්වල ඵලදායී පීව කාලය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව නැවත තක්සේරු කර නොතිබුණි.

(ඈ) එකතුව රු. 2,550,000 ක් වූ කළුබෝවිටියාන හා දෑරංගල කර්මාන්තශාලා පිහිටි ඉඩම් 1994 වර්ෂයේදී අත්පත් කරගැනීමෙන් පසුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව මේ දක්වා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ බැංකු ණය පොලී වියදම රු.1,674,073 ක් වුවද එය රු. 1,298,624 ක් ලෙස රු. 375,450 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඊ) විවිධ ණයහිමි වටිනාකම, මූල්‍ය ප්‍රකාශන අනුව රු. 8,875,372 ක් හා උපලේඛනය අනුව වටිනාකම රු. 8,682,151 ක් වූ බැවින් රු. 193,221 ක නොසැසඳුනු වෙනසක් නිරීක්ෂණය විය.

(උ) ඉදිරියට කළ ගෙවීම් හා වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ වෙනත් අත්තිකාරම් වශයෙන් රු. 1,408,881 ක් නිරූපනය වන අතර විගණනයට ඉදිරිපත් කරනු ලැබූ උපලේඛනයට අනුව මෙම ශේෂයන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සිදු වූ ගනුදෙනු මත ඇතිවුණු ශේෂ විය. දීර්ඝ කාලයක සිට පැවත එන මෙම ශේෂ මතභේදාත්මක අයිතමයන් ලෙස විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඌ) පුස්සැල්ල වැවිලි සමාගමට අයත්, ගිරාගම වතුයායෙන් සමාගම වෙත ගෙවිය යුතු මුදලක් නොමැති බව ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ශේෂ සනාථන ලිපි අනුව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු. 1,046,771 ක් එම සමාගමෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL





1.3 සමාගමේ 2020/2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020/2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020/2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 162 (2) (අෑ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අෑ), (ඒ) , 2.2.4, 3 (ආ), (ඇ), (උ) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිර්ක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

වගුව - 14

නීතිරීති/විධානයට යොමුව	නිරීක්ෂණ
අංක පීඑඩී/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
(i) 8.2.2 වගන්තිය	අරමුදල් ආයෝජනයේදී මුදල් අමාත්‍යවරයාගේ සහ අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2021 මාර්තු 31 දිනට සමාගම විසින් රු. 159,454,572 ක් කෙටිකාලීන තැන්පත්වල ආයෝජනය කර තිබුණද ඒ අනුව අවශ්‍ය අනුමැතීන් ලබාගෙන නොතිබුණි.
(ii) 9.14 වගන්තිය	මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

– කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම පුද්ගලික සැපයුම්කාර සමාගමකින් රු. 23,414,275 කට 2014 වර්ෂයේදී මිලදී ගන්නා ලද ජල තාප උත්පාදන යන්ත්‍රයක් සඳහා සැපයුම් කොන්දේසි ප්‍රකාරව සැපයිය යුතු රේඩියේටර් යන්ත්‍ර 02 ක් නොසැපයීම නිසා රු. 1,566,002 ක් රඳවාගෙන තිබුණි. මෙසේ තිබියදී ජල තාප උත්පාදන යන්ත්‍රය සවිකිරීමද දෝෂ සහිතව සිදුකර ඇති බැවින් මෙම මුදල නොගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2016 දෙසැම්බර් මස 21 දින තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම ශේෂය නිරවුල් කර නොතිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සමාගම සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතු ඇප ලෙස තබමින් රාජ්‍ය බැංකුවකින් රු. 8,490,000 ක අයිරා පහසුකම් ලබාගෙන තිබූ අතර සමාලෝචිත කාලපරිච්ඡේදය අවසාන වන විට රු. 62,973,870 ක අයිරා ශේෂයක් පවතින අතර එම නිසා 2020/2021 වර්ෂය සඳහා අයිරා පොලී ලෙස රු. 9,358,767 ක් ගෙවා තිබුණි.එමෙන්ම තවදුරටත් රු. 18,500,000 ක් කාරක ප්‍රාග්ධන ණය මුදලක් ලබා ගෙන ඇති අතර ඒ සඳහාද සමාලෝචිත වර්ෂය තුළ රු. 1,298,623 ක පොලී ප්‍රමාණයක් ගෙවා ඇති අතර ශුද්ධ මූල්‍ය ආදායම සෘණ අගයක් තවදුරටත් ගැනීමට එය හේතු වී තිබූ අතර මූල්‍ය තත්ත්වය යහපත් අයුරින් පවත්වා ගැනීමට කළමණාකාරිත්වය අපොහොසත් වී තිබුණි.

(ආ) සමාගම 2015 වර්ෂයේදී තේ ශක්ති අරමුදලට වාර්ෂිකව සියයට 11 ක පොලී අනුපාතිකයක් මත රු. මිලියන 50 ක ණය මුදලක් ලබා දී තිබූ අතර රු. 59,532,264 ක් වැයකර තේ ශක්ති අරමුදලට අයත් මැණික්දිවෙල ඉඩමේ ගොඩනැගිලි ඉදිකර තිබුණි. අංක අමප/19/0743/117/024 හා 2019 මාර්තු 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීන්දුව ප්‍රකාරව ණය මුදල, අදාළ පොලිය හා සමාගම වැය කරන ලද සංවර්ධන වියදම් වෙනුවෙන් හිනිදුම හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවල අයිතිය නීත්‍යානුකූලව මෙම සමාගම වෙත පවරාගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයිතිය පවරාගෙන නොතිබුණු අතර වාර්ෂිකව රු. 5,500,000 ක් බැගින් වූ ලැබිය යුතු පොලී මුදල ද ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) තේ ශක්ති අරමුදල ආරම්භ කරන ලද හිනිදුම හිල්ස් හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලා නිෂ්පාදන කටයුතු කිරීම සඳහා පවරා දෙමින්, මෙම කර්මාන්තශාලා දෙක මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී ලාභදායී ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලු කටයුතු සමාගම විසින් සිදු කළ යුතු බව අංක අමප/19/0743/117/024 හා 2019 මාර්තු 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් දන්වා තිබුණි. 2015 වර්ෂයේදී සමාගමට මෙම කර්මාන්තශාලා ලබාදීමෙන් පසු සමාලෝචිත වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභදායී තත්වයක් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අලාභය රු. 112,475,388 ක් විය. එමෙන්ම දෑරණගල තේ කර්මාන්තශාලාවද 2015 වසර සිට සලකා බැලීමේදී අඛණ්ඩව අලාභ ලබමින් පැවතුනි.

(ඈ) වර්ෂ හතරකට වැඩි කාලයක සිට තේ ශක්ති අරමුදලට සහ තවත් පෞද්ගලික සමාගම් දෙකකට ගෙවිය යුතු එකතුව රු. 3,710,375 ක් ගිණුම් ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබිණි. අදාළ ආයතන විසින් මෙම මුදල් වලට හිමිකම් නොපෑම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ඉ) වර්ෂ හතරකට වැඩි කාලයක සිට චෙක්පත් අවලංගු කිරීම සහ උපයන විට ගෙවීම් අධිභාර පිළිවෙලින් රු. 843,158 ක් හා රු. 59,344 ක් උපචිත වියදම් ගිණුමෙහි ඇතුළත් කර ඇති අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබිණි.

(ඊ) වෙළඳ ණයහිමියන් යටතේ වසර හතරකට වැඩි කාලයක සිට ගෙවිය යුතු රු. 1,582,797 ක වටිනාකමින් යුතු ශේෂයන් නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පවතින අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබිණි.

(උ) 2009 වර්ෂයේ සිට පුද්ගලික තේ තැරැව්කාර ආයතනයකින් සමාගමට ලැබිය යුතු රු. 798,461 ක් ඉදිරියට ගෙන එමින් පැවති අතර, එය අයකර ගැනීමට විගණන දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඌ) 2003 වර්ෂයේදී බීසීසී ලංකා ලිමිටඩ් සමාගමට රු.10,000,000 ක ණය මුදලක් සියයට 22 ක පොලී අනුපාතිකයක් මත වාරික 12 කින් අයකර ගැනීමේ පදනම මත ලබාදී තිබුණු නමුත් ඉන් කිසිදු වාරිකයක් අයකරගැනීමට නොහැකිවී තිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ණය හා පොලී මුදල රු. 58,382,429 ක් විය.

(එ) සමාගමේ තේ කර්මාන්තශාලා 04 සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රධාන අරමුණු කිහිපයක් ඉටුකරගැනීමේ අරමුණින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එක් එක් අංශයන්හි ප්‍රගතිය සමස්තයක් ලෙස සළකාබැලීමේදී මුළු ඇස්තමේන්තුගත වියදම වූ රු.මිලියන 154 න් උපයෝජනය රු.මිලියන 12 ක් පමණක් වන බව නිරීක්ෂණය වූ අතර භෞතිකමය වශයෙන්ද ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමාගම අපොහොසත්ව තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළදී කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් ධාරිතාවය වර්ධනය කර ගැනීම සහ කාර්යාල උපකරණ ඇතුළු අවශ්‍යතා සැපයීම අරමුණු කර රු. මිලියන 3.32 ක් ද අලෙවිසැලෙහි විකුණුම් මසකට කිලෝ ග්‍රෑම් 16,000 ක් දක්වා වැඩි කර ගැනීමේ අරමුණින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහ විදේශීය ගැණුම්කරුවන් සොයාගැනීම ඇතුළු කාර්යයන් සඳහා රු. මිලියන 4.5 ක් ද ප්‍රතිපාදනය කර තිබුණද එම මුදල් කිසිවක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපයෝජනය කර නොතිබුණි.

(ඔ) ඉදිරියට කළ ගෙවීම් හා වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ වෙනත් අත්තිකාරම් වශයෙන් රු. 1,408,881 ක් නිරූපනය වන අතර විගණනයට ඉදිරිපත් කරනු ලැබූ උපලේඛනයට අනුව මෙම ශේෂයන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සිදු වූ ගනුදෙනු මත ඇතිවුණු ශේෂ විය. දීර්ඝ කාලයක සිට පැවත එන මෙම ශේෂ මතභේදාත්මක අයිතමයන් ලෙස විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම
ලාභ හෝ පාඩු සහ අනෙකුත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

වගුව - 15

මාර්තු 31න් අවසන් වසර සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම	සටහන	2020/2021 Rs.	2019/2020 රු.
ආදායම	3	**1,175,716,247.36**	937,789,275
විකුණුම් පිරිවැය	4	**(1,158,860,303.57)**	(845,680,913)
දළ ලාභය		**16,855,943.79**	92,108,362
අනෙකුත් මෙහෙයුම් වියදම්	5	**15,240,381.46**	7,201,626
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය		**32,096,325.25**	99,309,988
පරිපාලන වියදම්	6	**(43,913,954.35)**	(50,712,395)
විකුණුම් සහ බෙදාහැරීම් වියදම්	7	**(646,594.68)**	(400,677)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ		**(12,464,223.78)**	48,196,916
මූල්‍ය ආදායම්	8.1	**11,508,748.27**	14,724,355
මූල්‍ය වියදම්	8.2	**(14,189,483.93)**	(19,653,695)
ශුද්ධ මූල්‍ය ආදායම		**(2,680,735.66)**	(4,929,340)
බදුකරණයට පෙර ශුද්ධ ලාභය		**(15,144,959.44)**	43,267,577
බදුකරණය	9	**1,001,556.55**	(5,535,371)
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය		**(14,143,402.89)**	37,732,205
කොටසක් සඳහා ඉපැයුම්	10.1	**(3.07)**	8.19
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය		**(14,143,402.89)**	37,732,205
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ)		**(4,425,522.44)**	(1,858,427)
විලම්බිත බදු ලාභ/(අලාභ)		**(619,573.14)**	–
වසර සඳහා මුළු විස්තීරණ ආදායම		**(19,188,498.47)**	35,873,778

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම
මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

වගුව - 16

මාර්තු 31 දිනට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම	සටහන	2020/2021 රු.	2019/2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	11	**168,505,013.36**	193,095,557
ජීව විද්‍යාත්මක වත්කම්	12	**6,098,448.51**	4,869,911
ජංගම නොවන මුළු වත්කම්		**174,603,461.87**	197,965,468
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	13	**149,056,716.07**	164,264,492
බිසිසි ලංකා සමාගමෙන් අයවිය යුතු මුදල්		**58,382,429.45**	55,646,517
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	14	**59,974,106.68**	26,240,371
ලැබිය යුතු ආදායම් බදු	25	**6,687,095.25**	10,849,290
කෙටි කාලීන ආයෝජන	15	**159,715,975.08**	167,092,024
මුදල් හා මුදලට සමාන දෑ	16	**9,936,406.97**	5,559,076
මුළු ජංගම වත්කම්		**443,752,729.50**	429,651,769
මුළු වත්කම්		**618,356,191.39**	627,617,237
ස්කන්ධ හා බැරකම්			
ස්කන්ධ			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	17	**46,375,070.00**	46,375,070
සංචිත	18	**373,451,741.71**	395,454,945
මුළු ස්කන්ධ		**419,826,811.71**	441,830,015
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	19	**23,643,060.93**	16,275,792
ණය හා ණය ගැනීම්	20	**6,027,778.19**	4,600,000
විලම්බිත බදු බැරකම	24	**5,450,382.53**	5,832,366
ජංගම නොවන මුළු බැරකම්		**35,121,221.65**	26,708,157
ජංගම බැරකම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	21	**83,499,046.84**	62,059,997
ණය හා ණය ගැනීම්	20	**16,933,333.08**	9,963,267
බැංකු අයිරා	22	**62,975,778.11**	87,055,800
මුළු ජංගම බැරකම්		**163,408,158.03**	159,079,064
මුළු ස්කන්ධ හා බැරකම්		**618,356,191.39**	627,617,237

පිටු 04 සිට 27 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත්තේ 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතා ප්‍රකාරව බව අපි සහතික කරමු.

කළමනාකරණ අධ්‍යක්ෂ *මූල්‍ය කළමනාකරු*

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

සභාපති *අධ්‍යක්ෂ*

... ජූනි 2021
කොළඹ

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

වගුව - 17

මාර්තු 31න් අවසන් වසර සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	මහ භාණ්ඩාගාරය රු.	ප්‍රාග්ධන සංචිත රු.	රඳවාගත් ලාභය රු.	එකතුව රු.
2019 අප්‍රේල් 01 දිනට ශේෂය - නැවත ප්‍රකාශිත	46,375,070.00	–	600,000.00	358,981,166.82	405,956,236.82
වසර සඳහා ශුද්ධ ලාභය	–	–	–	37,732,205.36	37,732,205.36
වෙනත් විස්තිරණ ආදායම				(1,858,427.00)	(1,858,427.00)
2020 අප්‍රේල් 01 දිනට ශේෂය - නැවත ප්‍රකාශිත	46,375,070.00	–	600,000.00	394,854,945.18	441,830,015.18
නඩු කටයුත්ත අනුව හඳුනාගත් ගෙවිය යුතු දෑ				(2,814,705.00)	(2,814,705.00)
වසර සඳහා ශුද්ධ ලාභය	–	–	–	(14,143,402.89)	(14,143,402.89)
වෙනත් විස්තිරණ ආදායම				(5,045,095.58)	(5,045,095.58)
2021 මාර්තු 31 දිනට ශේෂය	46,375,070.00	–	600,000.00	372,851,741.71	419,826,811.71

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

වගුව - 18

මාර්තු 31වන් අවසන් වසර සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම	සටහන්	2020/2021 Rs.	2019ඊ2020 සිංහ
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල්			
බදුකරණයට පෙර ශුද්ධ ලාභය/(අලාභය)		**(15,144,959)**	43,267,577
ගැලපීම්			
ක්ෂයවීම		**32,674,793**	33,428,195
විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය සඳහා ප්‍රතිපාදනය		**4,120,319**	3,093,374
වත්කම් බැහැර කිරීම් මත ලාභය		**–**	–
ලියා හළ ආර්ථික සේවා ගාස්තු		**–**	6,362,903
පොළී ආදායම		**(11,508,748)**	(14,724,355)
කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් ලාභය/පාඩුව		**10,141,405**	71,427,693
භාණ්ඩ ලේඛන (වැඩිවීම්)/අඩුවීම්		**15,207,775**	(61,472,707)
වෙළඳ සහ අනෙකුත් අයවිය යුතු (වැඩිවීම්)/අඩුවීම්		**(33,733,736)**	20,079,583
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු (වැඩිවීම්)/අඩුවීම්		**18,624,344**	(16,980,303)
වෙහෙයුම්වලින්/(භාවිතා කරනු ලැබූ) උත්පාදිත මුදල්		**10,239,790**	13,054,266
ගෙවන ලද පාරිතෝෂික		**(1,178,573)**	(542,500)
ගෙවන ලද බදු		**4,162,195**	(3,422,829)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ලාභය/(භාවිතා කළ)		**13,223,412**	9,088,936
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම		**(8,084,250)**	(2,375,616)
පිව විද්‍යාත්මක වත්කම් අත්කර ගැනීම		**(1,228,538)**	(1,821,490)
දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම		**–**	–
ලැබුණු පොළිය		**11,508,748**	14,724,355
මූල්‍ය වත්කම්වල ශුද්ධ වෙනස්කම්		**4,640,136**	(4,995,266)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්		**6,836,097**	5,531,983
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/(භාවිතා කළ)			
ණය හා ණයගැනුම්වලින් අය		**8,397,844**	(18,350,000)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ/(භාවිතා කළ)		**8,397,844**	(18,350,000)
මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		**28,457,353**	(3,729,081)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දේ		**(81,496,724)**	(77,767,644)
වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දේ	16	**(53,039,371)**	(81,496,724)

ගිණුම් ප්‍රකාශන සඳහා සටහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. වාර්තාකරණ අස්තිත්වය

1.1 සංස්ථාමය තොරතුරු

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් 30 දින සංස්ථාගත කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2009 ජූනි 16 වන දින යළි ලියාපදිංචි කරන ලද ඇපයෙන් සීමිත වූ, ශ්‍රී ලංකාව නිත්‍ය වාසස්ථානය වන සමාගමකි.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙහි පිහිටා තිබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ තේ වගාකිරීම සහ නිෂ්පාදනය සහ තේ වගාකරුවන්ගෙන් සහ තමන්ටම අයත් වතුයායයලින් මිලදී ගත් තේ අලෙවි කිරීමයි.

1.3 අධ්‍යක්ෂවරු

2021 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය මේ සමගින් ඉදිරිපත් කරයි. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

2021 මාර්තු 31 දිනට සමාගමේ අධ්‍යක්ෂවරුන් වූයේ-

ඩී. කේ. අමින්ද උමේෂ් රොද්‍රිගෝ මහතා

ඩබ්. ඒ ඉන්ද්‍රාණි සුගතදාස මිය

එච්. හේමාල් කස්තුරිආරච්චි මයා

දොන් උපුල් අබේසුන්දර මයා

ඩබ්. කේ. බී. ටී. කුමාර අල්විස් මයා

ජයන්ත විජේසිංහ මයා

ආර්. සී. ඩී. ජයවර්ධන මයා

ඩී. එම්. එම්. දිසානායක මයා

1.4 සමාගමේ ලේකම්වරු

කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම
216, ද සේරම් පෙදෙස,
කොළඹ 05.

1.5 ලියාපදිංචි කාර්යාලය

අංක 53,
රත්නායක මාවත,
පැලවත්ත,
බත්තරමුල්ල

1.6 විගණකවරු

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

1.7 මූල්‍ය ප්‍රකාශන නිකුත්කිරීමට බලය පැවැරූ දිනය

2021 මාර්තු 31න් අවසන් වසර සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය 2021 ජූනි 25 වන දින බලය පවරන ලදී.

2. සාමාන්‍ය ප්‍රතිපත්ති

2.1 පිළියෙල කිරීමේ පදනම

සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහාවූ සටහන්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS and SLFRs) අනුකූලවය

2.2 මැණීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකමට අදාළව යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදුකර ඇති අවස්ථාවන්හි හැර මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමිනි. වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව සහ සාපේක්ෂ ද්‍රවශීලතාව පිළිබිඹු කරන ආකාරයෙන් කණ්ඩායම් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී වැදගත් ඇස්තමේන්තු ක්ෂෙත්‍ර, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල ඇතුලත් කර තිබේ.

2.3 බදුකරණය

(අ) ප්‍රවර්තන බදු

මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි තදනන්තර සංශෝධනයන්හි විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇත.

(ආ) විලම්බිත බදු

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත බදු සපයනු ලැබ ඇත්තේ, මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සහ බදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයන් සඳහා වත්කම් සහ බැරකම් අතර ධාරණ ප්‍රමාණවල තාවකාලික වෙනස්කම්වලට විධිවිධාන සලස්වමිනි. විලම්බිත බදු මනිනු ලබන්නේ වාර්තාකරණ දිනය වන විට පනවා ඇති නීති මත පදනම්ව, තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්තනය කළ විට ඒවාට ආදේශ කිරීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයටය.

විලම්බිත බදු වත්කම් පිළිගනු ලබනුයේ එම කාල අන්තරවලට සාපේක්ෂව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි අනාගත බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාවක් ඇති ප්‍රමාණයටය. එක් එක් වාර්තාකරණ දිනයේදී විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමේ ඉඩක් තවදුරටත් නොමැතිවීමේ ප්‍රමාණයට අඩුකරනු ලැබේ.

2.4 වත්කම් තක්සේරුව සහ ඒවා මැනීමේ පදනම

2.4.1 දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත හා උපකරණ සඳහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමේ කිසියම් හානියක් වේ නම් එය අඩු කර පිරිවැයට හෝ සාධාරණ අගයටය. සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස්වීම් මගින් ධාරණ වටිනාකම යළි අය කර ගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී, දේපල, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම හානිවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියලු දේපල, පිරියත හා උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ ඒවායේ පිරිවැය මත ය. දේපල, පිරියත හා උපකරණ තදනන්තරව ප්‍රතිප්‍රමාණ කර ඇති අවස්ථාවන්හිදී එබඳු වත්කම්වල සමස්ත කාණ්ඩයම සාධාරණ අගය මත ප්‍රතිප්‍රමාණ කරනු ලැබේ. මෙම ප්‍රතිප්‍රමාණ කිරීම ප්‍රමාණවත් නිත්‍යතාවකින් සිදු කරනු ලැබේ. යම් දේපලක් ප්‍රතිප්‍රමාණ කළ අවස්ථාවක එහි ධාරණ වටිනාකම වැඩිවීමත් සිදුවී ඇති අවස්ථාවක පෙර ආදායම් ප්‍රකාශවල සඳහන් වී ඇති එකී දේපල අවමවීමක් ලෙස සටහන් වූ අවස්ථාවකදී හැර එය ප්‍රතිවටිනාකම් සංචිතයට සෘජු ලෙස බැර කරනු ලබන අතර එවන් අවස්ථාවකදී වැඩිවීමම අදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. එකම වත්කමෙහි පෙර අතිරික්තයක් හිලව් කරන්නා වූ යම් ප්‍රත්‍යාගණන හිඟයක්, ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තයට සෘජුවම හිලව් කරන අතර යම් අතිරික්තයක් වේ නම් එය වියදමක් ලෙස පිළිගනු ලැබේ.

බැහැර කිරීමේදී විකුණනු ලැබූ වත්කමට අදාළ කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් වේ නම් එය රඳවාගත් ඉපැයුම්වලට පවරනු ලැබේ. යම් දේපල, පිරියත හෝ උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කිරීමේදී හෝ බැහැර කිරීමේදී හෝ ඒවායේ භාවිතය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම් ඒවා ඉවත් කරනු ලැබූ සේ සැලකේ. එසේ වත්කම් ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන කිසියම් ලාභයක් හෝ පාඩුවක් එලෙස ඉවත් කිරීම සිදු කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ඇතුළු කරනු ලැබේ.

(අ) ක්ෂයවීම

පිරිවැය මත සරල රේඛීය ක්‍රමය භාවිතා කිරීම මගින් හෝ සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලු දේපල, පිරියත සහ උපකරණ තක්සේරු කිරීම මගින් එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ එම ප්‍රමාණ පොත් වලින් ඉවත් කිරීම පිණිස, ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ.

වගුව - 19

වත්කම් කාණ්ඩය	අවුරුදු
ගොඩනැගිලි	20
ජලය සහ විදුලිය	20
මෝටර් රථ	4
පිරියත හා යන්ත්‍රෝපකරණ	8
උපකරණ	8
ලී බඩු සහ උපාංග	8
පරිගණක උපකරණ	8
මාර්ග	10
වෙනත්	8
ජීවවිද්‍යාත්මක වත්කම් (තේ)	30

සින්නක්කර ඉඩම් සඳහා අසීමිත ආයු කාලයක් ඇතැයි සලකන බැවින් ඒවා ක්ෂය කරනු නොලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම, උචිත නම් වත්කමේ අවශිෂ්ඨ වටිනාකම් ප්‍රයෝජ්‍ය ජීවිත කාල සහ ක්ෂයකිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කොට ගලපනු ලැබේ.

(ආ) ප්‍රතිසංස්කරණ පිරිවැය

මුලින්ම තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රකෘතිමත් කරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දැරූ වැය, එලෙස දැරූ විටදී වියමදක් ලෙස පිළිගනු ලැබේ.

2.4.2 ජීවවිද්‍යාත්මක වත්කම්

සමාගම ජීව විද්‍යාත්මක වත්කම් හඳුනාගනු ලබන්නේ පිරිවැය පදනමෙනි. සමාගමේ ජීව විද්‍යාත්මක වත්කම් ක්‍යබෝවිටියාන සහ දෑරංගල ඇති තේ පඳුරුවලින් සමන්විත වේ. සමාගම පැල අවුරුදු 3 දක්වා නොමේරූ ලෙස ද අවුරුදු 3ට වඩා පඳුරු මේරූ ලෙස ද පිළිගනියි.

2.4.3 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

සමාගම මුලින්ම ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා උත්පාදනය කරනු ලැබූ දිනයට හඳුනාගනු ලබයි. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට නිශ්චය කරනු ලැබූ වත්කම් ඇතුළුව) සාධන පත්‍රයේ ගිවිසුම්කර ප්‍රතිපාදනයන්ට සමාගම පාර්ශවයක් වූ වෙළඳ දිනයට මුලින්ම පිළිගනු ලැබේ.

මුදල් ප්‍රවාහය වෙත වත්කමෙහි ගිවිසුම්කර හිමිකම් අවසන් වන විටදී හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පාරිතෝෂ සැලකිය යුතු ලෙස පවරනු ලබන ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතින් එය පවරන විටදී සමාගම මූල්‍ය වත්කමක හඳුනාගැනීම ඉවත් කරයි. සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳාවාගනු ලබන, පවරනු ලැබූ මූල්‍ය වත්කම්වල කවර හෝ බැඳීමක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලබයි.

මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීමේ කාර්යය සඳහා, සමාගමේ මූල්‍ය වත්කම් ඇගයීම මුල් යෙදුමේ දිනය වන 2020 අප්‍රේල් 1 දිනට සිදුකරනු ලැබ ඇති අතර අනතුරුව 2020 අප්‍රේල් 1 දිනට පෙර හඳුනාගැනීම අත් නොහරිනු ලැබූ මූල්‍ය වත්කම් වෙත අතීතයට බලපාන පරිදි ආදේශ කර තිබේ. ණය සාධනපත්‍ර මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තනිකරම සමන්විත වනුයේ මුල් මුදල සහ පොළියෙන් ද යන්න ඇගයීම සිදුකරනු ලැබූයේ වත්කම්වල මූල් පිළිගැනීමේදී පැවැති කරුණු සහ අවස්ථානුගත තත්ත්වයන් මත පදනම්වය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9හි වර්ගීකරණ සහ මැනීමේ අවශ්‍යතා, සමාගමේ ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය මත ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොකරන අතර එබැවින් සමාගම පෙර කාල සීමාවන් සඳහා සන්සන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කොට නොමැත.

සමාගම සතුව පහත දැක්වෙන මූල්‍ය වත්කම් තිබේ. (ව්‍යුත්පන්න නොවන)

- ණය හා ලැබිය යුතු දේ
- මුදල් හා මුදලට සමාන දේ

(ආ) ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. එබඳු වත්කම් මුලින්ම සාධාරණ අගය සහ සෘජුව ආරෝපණය කළ හැකි කිසියම් ගනුදෙනු පිරිවැයකට පිළිගනු ලැබේ. මූලික පිළිගැනීමට තදනන්තරව, ණය හා ලැබිය යුතු දෑ ගණනය කරනු ලබන්නේ යම් හානිකරණ අලාභ අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයටය. ණය සහ ලැබිය යුතු දෑ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෙයින් සමන්විත වේ.

(ඇ) මුදල් හා මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන්හි, මුදල් හා මුදලට සමාන දෑ මුදල් ශේෂ හා මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ. ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි සහ සමාගමේ මුදල් කළමනාකරණයේ අනුකලන කොටසක් වන්නාවූ බැංකු අයිරා මුදල් හා මුදලට සමාන දේවල සංරචකයක් ලෙස මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා අන්තර්ගත කොට ඇත. මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් හා බැංකුවේ තැන්පතුවලින් සමන්විත වේ. වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් සකස් කොට ඇති මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා මුදල් හා මුදලට සමාන දෑ සංරචකයක් ලෙස බැංකු අයිරා අන්තර්ගත කොට ඇත.

2.4.4 හානිකරණය

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් දරනු නොලබන මූල්‍ය වත්කමක්, එය හානිවූ බවට වාස්තවික සාක්ෂි තිබේදැයි නිර්ණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ඇත.

වත්කමේ මූලික පිළිගැනීමෙන් පසු අලාභ සිදුවීමක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි මගින් පෙන්නුම් කරන්නේ නම් සහ විශ්වාසනීය ලෙස මිණිය හැකි එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට නිශේධනීය බලපෑමක් එම අලාභ සිදුවීම ඇති කළේ නම් මූල්‍ය වත්කමක් හානිවී ඇත.

ලැබිය හැකි දේ සඳහා හානි පිළිබඳ සාක්ෂි සමාගම සාමූහික මට්ටමේදී සලකා බලයි. සමාන අවදානම් ගතිලක්ෂණ සහිත ලැබිය හැකි සියලු දේ එකට කාණ්ඩ කරන අතර සිදුව ඇති එහෙත් මෙතෙක් හඳුනාගෙන නොමැති කිසියම් හානියක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ඇත.

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කමකට අදාළ හානි අලාභයක් එහි ධාරණ වටිනාකම හා වත්කමේ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ. අලාභවීම් ලාබ හෝ පාඩුවල පිළිගනු ලබන අතර ලැබීම්වලට සාපේක්ෂව දීමනා ගිණුමක පෙන්නුම් කරනු ලැබේ. හානිවූ වත්කමක් මත පොළිය, වට්ටම අනාගතයට ගැලපීම හරහා අඛණ්ඩව පිළිගනු ලැබේ. පසුව ඇතිවන සිදුවීමක් හානි අලාභ වටිනාකම අඩුකිරීමට හේතුවන්නේ නම්, ලාබ හෝ පාඩු හරහා හානි අලාභයේ අඩුවීම ප්‍රතිවර්තනය කරනු ලැබේ.

2.4.5 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිසකසන ලද, පිරිනොසකසනලද හා අර්ධ පිරිසකසන ලද කෘෂිකාර්මින නිෂ්පාදන සහ අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍යයන්ගෙන් සමන්විත වේ. පිරිසකසන ලද, පිරිනොසකසනලද හා අර්ධ පිරිසකසන ලද කෘෂිකාර්මින නිෂ්පාදන මූල්‍ය කාල සීමාව අවසානයේදී පූර්ණව පිරිසකසන ලද කෘෂිකාර්මින නිෂ්පාදන සේ සළකනු ලබන අතර ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයට තක්සේරු කරනු ලැබේ.

අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තක්සේරු කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. වට්ටෝරු භාණ්ඩ විකිණීමේදී, එම වට්ටෝරු භාණ්ඩයන්හි ධාරණ මුදල අදාළ ආදායම පිළිගනු ලැබූ කාලසීමාවේ වියදමක් ලෙස සමාගම පිළිගනු ලබයි.

2.5 බැරකම් සහ ප්‍රතිපාදන

අතීත සිදුවීමකින් මතුවන වත්මන් බැඳීමක් පියවීමේදී ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් එහි ප්‍රතිඵලය වේයැයි අපේක්ෂා කරනු ලබන විටදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ බැරකම් පිළිගනු ලැබේ. ණයකරු ඉල්ලා සිටි විටදී හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්වය දිනයේ සිට එක් වසරකට පසුව ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් සේ සලකනු ලැබේ.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති හා ඒ සඳහා විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සෑදිය හැකිවීම අවශ්‍ය කරනු ලබන විටකදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

2.5.1 විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්

(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ආයුගණක තක්සේරුව අනුව විශ්‍රාම ප්‍රතිලාභී අනුකූලව සේවා නියුක්තියේ පළමු වසරේ සිට විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් පූර්ණ ප්‍රතිපාදනයක් සලසා ඇත.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නිර්ණය කිරීමේදී භාවිතා කරනු ලබන වැදගත් උපකල්පනයන්ට පහත දෑ ඇතුලත් වේ.

ආබාධිතබව: මර්ත්‍යතා වගුවෙන් 10% ක්

කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාත: වයස අවුරුදු 54 දක්වා සියලු දෙනාට 1.00% සහ ඉන් අනතුරුව ශූන්‍ය වේ.

සමාන්‍ය විශ්‍රාම ගැනීමේ වයස: අවුරුදු 60 (නිශ්චිත විශ්‍රාම වයසට වඩා වැඩි සේවකයන් ඔවුන්ගේ ඊළඟ උපන් දිනයට විශ්‍රාම යන්නා සේ උපකල්පනය කරනු ලැබේ.)

වට්ටම් අනුපාතය: වාර්ෂිකව 8.00%

වැටුප් උද්ගමන අනුපාත: මූලික වැටුප: කාර්ය මණ්ඩලය වසරකට 8.00%. දත්තවල නිශ්චිතව දක්වා ඇති මාසයට සෑම වසරකම වැටුප් වර්ධක ලැබීමට නියමිතය.

මූලික වැටුප: දෛනික වැටුප්ලාභී සේවකයන්: වසරකට 8.00%, මීළඟ වැටුප් වර්ධකය 2021 අප්‍රේල් මස ලැබීමට නියමිතය.

දීමනා: අදාළ නොවේ.

විශ්‍රාම පාරිතෝෂික සූත්‍රය: කාර්ය මණ්ඩලය: යටත් පිරිසෙයින් 5 වසරක සේවා කාලයක් ඇති අය සඳහා සේවයේ සම්පූර්ණ කළ සෑම වසරක් සඳහාම මාස භාගයක වැටුප

දෛනික වැටුප්ලාභී සේවකයන්: යටත් පිරිසෙයින් 5 වසරක සේවා කාලයක් ඇති අය සඳහා සේවයේ සම්පූර්ණ කළ සෑම වසරක් සඳහාම දින 14ක වැටුප

(ආ) සැලසුම්ගත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාල ප්‍රඥප්ති සහ නියමයන් ප්‍රකාරව සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායක මුදල් වලට සුදුසුකම් ලබයි.

2.6 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2.6.1 ආදායම හඳුනාගැනීම

